භූපති සහ චාරුලතා වෙසෙන සුවිසල් නිවහනෙහි ස්වභාවය ප්‍රකාශ කිරීම සඳහා රේට වැය වී ඇත්තේ රූපරාමු කිහිපයක් පමණි. මධ්‍යම රූප භාවිතයෙන් නිවසෙහි සැරසිලි යනාදිය විශද කිරීමට සමත් ව තිබේ. නිදන කාමරයෙහි පවතින වික්ටෝරියානු සම්ප්‍රදාය සිහි ගන්වනසුලු යහන්, බිත්ති මත තිබෙන රටා සහිත කඩදාසි යනාදිය එකී සුවිසල් නිවසෙහි විද්‍යමාන සංස්කෘතික තත්ත්වයන් ය.

සිනමා කෘතියෙහි අවසානයත් නවකතාවේ අවසානයත් අතිශයින් සාම්‍යත්වයක් උසුලන බව කිව හැකි ය. එසේ වුව ද පසුබිම් හඬත් රූපරාමු මගිනුත් චිත්‍රපටයට සජීවීත්වයක් ආරෝපණය වී තිබේ. භූපති විසින් චාරුලතා තනි කොට දමා යන අවස්ථාව සිනමා කෘතියෙහි අතිශය සංවේදී අයුරින් නිරූපණය වෙයි. සයනාසන්න ව වැතිරී කඳුළු පිරි දෙනෙතින් යුතු ව සිටි චාරුලතා භූපති පිට ව යන දසුන නැරඹීමට ද්වාරය අසලට පැමිණෙයි. දූරස්ථ රූපයක් උපයෝගී කරගෙන එම අවස්ථාව සිනමාවට නඟා තිබේ. එයින් අනතුරුව හදවතින් වැළපෙන චාරුලතාගේ දෙනෙතින් ගලා හැලෙන කඳුළු සමීප රූපයකින් ප්‍රේක්ෂකයාට විද්‍යමාන කරවීමට සත්‍යජිත් රේ උත්සුක වී තිබේ. එය චිත්‍රපටය නරඹන්නාගේ භාව සංවේදී කරවීමෙහි ලා සමත් ය.

බටහිර ජාතීන් විසින් ස්වකීය ආධිපත්‍යයට යටත් කර ගනු ලැබූ ඉන්දියාව වැනි රටවල සමාජයෙහි පවුල නම් වූ කේන්ද්‍ර ස්ථානයට අත් වූ ඉරණම චාරුලතා චිත්‍රපටයට උපයෝගී කර ගෙන තිබේ. ඒ අනුව විපර්යස්ථ ජන ජීවිතය කෙරෙහි සත්‍යජිත් රේ කොතෙක් දුරට ස්වකීය අවධානය යොමු කොට ඇති ද යන්න ප්‍රතීයමාන වෙයි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

සමාජ පැවැත්මෙහි ජනයාගේ විපර්යස්ථ ජීවිත පිළිබඳ ව ස්වකීය සිනමා කෘති ගණනාවක දී ම අවධානය යොමු කොට තිබෙන සත්‍යජිත් රේ විසින් අධ්‍යක්ෂණය කරන ලද තවත් එබඳු චිත්‍රපටයක් වශයෙන් **'Shatraj ke khilari'** හැඳින්විය හැකි ය. ඒ සඳහා පාදක කොට ගැනුණේ ප්‍රේම්චාන්ද් විසින් ලියන ලද කෙටිකතාවකි. 1977 වර්ෂයේ තිරගත වුණු තදීය සිනමා කෘතියෙහි ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලන සමය පසුබිම් කොටගෙන තැනුණකි. යටත්විජිතසමය පදනම් කරගෙන සත්‍යජිත් රේ විසින් අධ්‍යක්ෂණය කළ ප්‍රථම චිත්‍රපටය ද වන මෙය **'චෙස් ක්‍රීඩකයෝ'** නමින් සිංහලට පරිවර්තනය විය.

ඔහුගේ සිනමා සම්ප්‍රදායෙහි කිසියම් විවිධත්වයක් දක්නට ලැබුණ ද ප්‍රධාන වශයෙන් ඔහුගේ කෘතිවලින් ඉස්මතු වන්නේ ඉන්දියානු සමාජය වෙනස් වන ආකාරයයි. සමකාලීන සමාජ වෙනස්වීම් සත්‍යජිත් ස්වකීය කෘතිවලට පාදක කොට ගැනීමට අමතර ව එම කෘතීන්ගෙන් ඔහු ගැඹුරු අන්දමින් සමාජ ගවේෂණයේ යෙදුණේ ය. මෙහි දී ඔහු පුළුල් වශයෙන් ඓතිහාසික සමාජ පරිසරය වෙත මෙන් ම මිනිස් චිත්තාභ්‍යන්තරය වෙත ද සමීප වූයේ ය. ඔහු ඓතිහාසික සමාජ පසුතලයක් ඔස්සේ සමකාලීන අත්දැකීම් ගවේෂණය කරමින් මිනිස් ආත්මයට එබී බලන අන්දම පිළිබඳ කදිම නිදසුනක් ඔහුගේ **'චෙස් ක්‍රීඩකයෝ'** චිත්‍රපටය දැක්විය හැකි ය.[10]

ප්‍රේම්චාන්ද්ගේ කෙටිකතාවේ මූලික හරය නොසිඳ එහෙත් වෙනස්කම් කිහිපයකට ලක්කොට **'චෙස් ක්‍රීඩකයෝ'** සිනමා කෘතිය අධ්‍යක්ෂණය කිරීමට සත්‍යජිත් රේ පෙලඹී තිබේ. මෙහි ලා කෙටිකතාවේ එන චරිතව අමතර ව චරිත ද්වයක් නිරූපණය කිරීම දැක්විය හැකි ය. මුන්ෂි නන්දලාල් සහ කල්ලො නමැති තරුණයන්ගේ චරිත මෙලෙස එක් කොට තිබේ. මුන්ෂි චෙස් ක්‍රීඩකයන්ගේ හිතවත් මිතුරෙකු වන අතර කල්ලො නමැත්තා සිනමා කෘතිය අවසානයට හමුවන්නෙකි. මෙම චරිතයන්හි එක්වීම කෙටිකතාවේ ගුරු අරුතට බාධාවක් ව නොමැත.

බ්‍රිතාන්‍ය රජය විසින් ලක්නව් නගරය 1856 දී යටත් කර ගැනීම නිරූපණය වන මෙම චිත්‍රපටයෙහි තදීය කාලසීමාවෙහි මිනිසුන්ගේ විපර්යස්ථ වූ ජන ජීවිතය පිළිබඳ විවරණයක් අන්තර්ගත වෙයි. ඖද් ප්‍රාන්ත රාජ්‍යයත් එහි අගනුවර වන ලක්නව් නගරයත් දහඅටවන ශත වර්ෂයේ අවසාන භාගයේත් දහනවවන ශත වර්ෂයේ මුල් භාගයේත් මෝගල් සංස්කෘතියේ මධ්‍යස්ථානය බවට පත් ව තිබුණු බව සැලකිය හැකි ය. එම කාලයෙහි වැසියන්ගේ ජීවිත විනිවිද දුටු සත්‍යජිත් රේ ස්වකීය සිනමාකෘතියට උපයෝගී කර ගන්නේ ද විපර්යාසයට ලක්වුණු ජීවිත ය.

මෙලෙස සමස්තයක් වශයෙන් ගත් කල සත්‍යජිත් රේ ස්වකීය සිනමා කෘතිවල දී විපර්යස්ථ වූ ජන ජීවිතය පිළිබඳ ව දැඩි ලෙස අවධානය යොමු කරමින් ඒවා වඩාත් තීව්‍ර ලෙස ප්‍රේක්ෂකයාට ඒත්තු ගැන්වීමට ස්වකීය සිනමා ශක්‍යතාව ඉවහල් කොට ගෙන අති බව තහවුරු කර ගත හැකි ය.

[10] වීරසිංහ. සේනාරත්න (1999). පරි: චෙස් ක්‍රීඩකයෝ. වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ. 08 පිට.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

## 7. නිගමනය

අප මුඛ්‍යාවධානය යොමු කළ සිනමා අධ්‍යක්ෂවරුන්ගේ සිනමා කෘති තුලනාත්මක සංසන්දනයේ දී ඒවායේ පවත්නා දැඩි ව පවත්නා සාම්‍යත්වය තහවුරු විය. විශේෂයෙන් ඔවුන් විසින් උපයෝගී කොටගත් අවශේෂ සාහිත්‍යාංගවල ආභාසය ඔස්සේ ගවේෂිත ප්‍රස්තුත ද අවධානයට යොමු කිරීමේ දී ඒ බැව් තව දුරටත් සනාථ වෙයි. එහෙත් රූප භාවිතය වැනි ඇතැම් සිනමා ශිල්පීය ලක්ෂණවල යම් යම් අනන්‍ය ලක්ෂණ දක්නා ලැබෙන බව ද මෙහි ලා සඳහන් කළ හැකි ය. විශේෂයෙන් සිනමාකරණයට පිවිසීම කෙරෙහි ද අවධානය යොමු කළ විට විද්‍යමාන වන පොදු සුලක්ෂණ කිහිපයක් ම අනාවරණය විය. ඒ අනුව මොවුන්ගේ සිනමාව එකම තලයක ගමන් ගන්නා බවත් බොහෝ දුරට අන්‍යෝන්‍ය සබඳතාවක් සිනමාකෘතිවල දක්නා ලැබෙන බවත් අවධාරණය වෙයි.

## 8. සමාලෝචනය

සෙසු කලා මාධ්‍යය හා සාපේක්ෂ ව ගත් කල සිනමාවට දිගු ඉතිහාසයක් නොමැති වුව ද මේ වනවිට එය බහුතර සහෘද අවධානය දිනා ගත් කලා මාධ්‍යයක් බවට පත් ව තිබේ. මේ සඳහා පූර්ව යුගයන්හි විසූ සිනමාකරුවන්ගෙන් ලැබී ඇත්තේ අනුපමේය දායකත්වයකි. ලෙස්ටර් හා සත්‍යජිත් රේ යනු ද එවැනි නිර්මාපකයෝ වෙති. දෙරටක වුව ද ඔවුන් අතුරෙහි සිනමා කාර්යයේ දී යම් යම් සබඳතා පැවැති බව මෙම පර්යේෂණයේ දී අනාවරණය විය. එමෙන් ම සිනමා ප්‍රවේශික සාම්‍යතා ගණනාවක් හඳුනාගත හැකි විය. සාහිත්‍යයෙන් මොවුන් ලද ආභාසය ද බොහෝ දුරට සමාන ය. එකී සාහිත්‍ය ඇසුරෙන් ඔවුන් ගවේෂිත ප්‍රස්තුත ද එක හා සමාන ය. ඒ අනුව මොවුන්ගේ සිනමාවෙහි සාම්‍යතා රැසක් දැක ගත හැකි බව පැවසීම යුක්ති යුක්ත ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරසේකර. දයා (2013). මාර්ටින් වික්‍රමසිංහගේ කෘතිවල සමාජ මානව විද්‍යාත්මක ලක්ෂණ. කොළඹ, ආරිය ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ. මාර්ටින් (2008). කලියුගය. රාජගිරිය, සීමාසහිත සරස පෞද්ගලික සමාගම.

සේනානායක. ජී.බී. (1996). පලිගැනීම. මුදුන්ගොඩ, තරංග ප්‍රකාශන.

හේරත්. සමන්ත (1997). සංස්, මඩවල රත්නායක සාහිත්‍ය නිර්මාණ විමර්ශන. කොළඹ, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

රත්නවිභූෂණ. ඇෂ්ලී (1993). සංස්, සිනෙසිත් අංක 26. 1993/4. බොරලැස්ගමුව, ආසියානු සිනමා කේන්ද්‍රය

සිංහආරච්චි. චින්තා ලක්ෂ්මී (2013). පරිඃ මාවතේ ගීතය. මුල්ලේරියාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය. ප්‍රස්ථාවනාව.

වීරසිංහ. සේනාරත්න (1999). පරි, චෙස් ක්‍රීඩකයෝ. වේයන්ගොඩ, ප්‍රභා ප්‍රකාශකයෝ.

වීරසිංහ. සේනාරත්න (2015). පරි, චාරුලතා. වේයන්ගොඩ, ප්‍රභා ප්‍රකාශකයෝ.

බෙල්ලන්විල ඕ.ටී. පෙරේරා (1994). සිනමාවෙන් සමුගත් සත්‍යජිත් රායි. කර්තෘ ප්‍රකාශන.


JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

# ගුණදාස අමරසේකරගේ හා මහගම සේකරගේ කාව්‍ය නිර්මාණයන්හි ගැබ්වන ජනකවි ආභාසය

# The influence gained by Amarasekara and Sekara through folk poems

සී. පවිත්‍රානි

JOURNAL OF THE FACULTY OF HUMANITIES

## Abstract

Gunadasa Amarasekara and Mahagama Sekara were powerful poets during the decades of 1950 and 1960' It appears that, both these Sinhala poets have been engaged in poeticism with the influence of various poetic traditions'. Among them'' folk songs hold a very special place in the poetic field'. Amalbiso˜ is a text where Amarasekara was strongly influenced by the folk song tradition while Sakvalihini˜ becomes Sekara's most effective influence in the folk poetry tradition. A variation of influence by these two composers gained from the folk song tradition could be clearly identified in the poem —Kinduru kumarige kathawa˜, in Sakvalihini and in the poetic creation —Amalbiso˜. Both these poems named Amalbiso˜ and —Kinduru kumarige kathawa˜ are based on a similar pattern of a story. Both these creations depict varied forms in poeticism. Although both Amarasekara and Sekara were influenced by folk poems, the poetic concepts that they built up were of completely different structures. Therefore, it is important to ascertain through a comparative investigation as to what form of influence has been gained by Amarasekara and Sekara through these folk poems.

***Keywords -*** Folk poems, Influence, Vision, Tradition

**සාරාංශය**

ගුණදාස අමරසේකර සහ මහගම සේකර 1950 සහ 1960 දශකවල සිංහල කාව්‍ය ක්ෂේත්‍රයේ කැපීපෙනෙන කවීහු වෙති. මෙම කවීන් දෙදෙනා ම විවිධ කාව්‍ය සම්ප්‍රදායන්ගේ ආභාසයෙන් කාව්‍යකරණයේ යෙදී ඇති අතර ජන කාව්‍ය සම්ප්‍රදාය ඒ අතර කැපී පෙනේ. ගුණදාස අමරසේකර රචනා කළ "අමල්බිසෝ" කාව්‍ය නිර්මාණය ඒ සඳහා නිදර්ශනයකි. එමෙන් ම සක්වාලිහිණි කාව්‍ය ග්‍රන්ථයේ පැනෙන "කිඳුරු කුමාරිගේ කතාව" යන මැයෙන් යුතු කාව්‍ය නිර්මාණය ජන කවි සම්ප්‍රදායෙන් සේකර ලැබූ ආභාසය ස්ඵුට කරන්නකි. එම කාව්‍ය නිර්මාණ සඳහා පාදක වී ඇත්තේ ද යම් තරමක සාම්‍යත්වයකින් යුතු වෘත්තාන්තයන් ය. ජන කාව්‍ය සම්ප්‍රදායෙන් මෙම නිර්මාණකරුවන් දෙදෙනා ම ලබා ඇති  බලපෑමේ ස්වභාවය තත් නිර්මාණද්වය සන්සන්දනාත්මක ව කියවීමෙන් ගම්‍යමාන කරගත හැකි වේ. මෙහිලා අපගේ අවධානය යොමු කෙරෙන විශේෂ කරුණක් වන්නේ අමරසේකර මෙන් ම සේකර ද ජන කාව්‍ය සම්ප්‍රදායෙන් බලපෑම ලබන්නේ විවිධත්වයක් සංකලක්ෂණය කෙරෙන අයුරින් වන බව යි.  එහි දී අමරසේකර වඩාත් නූතනවාදී ආකාරයෙන් සාම්ප්‍රදායික අමල්බිසෝ කතාවේ අර්ථය අද්‍යතන අනුභූතියකට සම්බන්ධ කරන අයුරු විමර්ශනය කළ හැකි ය. ඒ හා සාපේක්ෂ ව බලන කල සේකර ස්වකීය කාව්‍ය නිර්මාණයට ජනකවියේ ආභාසය ලබන්නේ අමරසේකර මෙන් රැඩිකල් ස්වරූපයකින් නොව සාම්ප්‍රදායික බෞද්ධ ජීවන පුරුෂාර්ථ මත මැනවින් රඳා සිටිමින් බව විද්‍යමාන වේ.

*ප්‍රමුඛ පද* - ජනකවි, ආභාසය, දෘෂ්ටිය, සම්ප්‍රදාය

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

## 1. හැඳින්වීම

ගුණදාස අමරසේකර හා මහගම සේකර 1960 දශකයේ ඉස්මතු වූ කවීන් දෙදෙනෙකි. කාව්‍යකරණය සම්බන්ධයෙන් ඔවුන් කළ නොයෙක් අත්හදාබැලීම් පසුකාලීන ව සිංහල කවිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කළේ ය. අමරසේකර හා සේකර යන දෙදෙනා ම නොයෙක් කාව්‍ය සම්ප්‍රදායවලින් ආභාසය ලැබූ බව පැහැදිලි කරුණකි. ඒ අතර ජන කවි සම්ප්‍රදාය බෙහෙවින් වැදගත් වේ. අමරසේකර ජන කවි සම්ප්‍රදායෙන් ලැබූ ආභාසය ඉතා ප්‍රබලව දිස්වන කෘතිය අමල් බිසෝ (1960) වන අතර සේකර කෙරෙහි ජන කවියේ බලපෑම වැඩි වශයෙන් පෙන්නුම් කරන්නේ සක්වාලිහිණි (1962) කාව්‍ය ග්‍රන්ථයයි. අමල් බිසෝ කෘතියෙහි පැනෙන එනමින් යුතු කාව්‍ය නිර්මාණය හා සක්වාලිහිණි ග්‍රන්ථයෙහි හමුවන කිඳුරු කුමාරිගේ කතාව කවිපෙළ ඇසුරින් මෙහිලා කවීන් දෙදෙනා ජන කවියෙන් ලබන ආභාසයේ විවිධත්වය විමර්ශනය කෙරේ.

## 2. සාහිත්‍ය විමර්ශන

ගුණදාස අමරසේකර හා මහගම සේකර ජනකවි සම්ප්‍රදායෙන් ආභාසය ලබා ඇත්තේ කවර ආකාරයෙන් ද? යන්න මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ගැටලුව යි. ඒ පිළිබඳ ව විමර්ශනයෙහිලා කේන්ද්‍රීය අවධානය අමරසේකරගේ අමල්බිසෝ කාව්‍යය ග්‍රන්ථයෙහි පැනෙන අමල්බිසෝ යන මැයෙන් යුතු නිර්මාණය හා මහගම සේකරගේ සක්වාලිහිණි කෘතියෙහි පැනෙන  කිඳුරු කුමාරිගේ කතාව කෙරෙහි යොමු කෙරේ. ඒ අනුව පර්යේෂණ සීමාව එම කාව්‍ය නිර්මාණ ද්වයෙන් සංලක්ෂණය කළ හැකි ය.

අමල් බිසෝ කාව්‍යයෙහි පෙරවදනෙහිලා අමරසේකර මෙසේ පවසයි.

"නූතන සිංහල කවිය ජන කවියෙන් ආභාසය ලැබීමට තැත් කළ ප්‍රථම ප්‍රයත්නය අමල් බිසෝ කාව්‍යයයි මම සිතමි. අමල් බිසෝ පළමු වරට ප්‍රකාශයට පත් කරන ලද්දේ පනස් ගණන්වල අග භාගයේදීයි. අමල් බිසෝ පළවීමෙන් පසු ජන කවිය ගුරු කොට ගත් නිර්මාණ කීපයක් හැට ගණන්වල මුල් භාගයේ දී පළවිය. මහගම සේකරගේ සක්වා ලිහිණි අමල් බිසෝ වැනි ම කවිකතාවකි."[11]

අමරසේකරට පෙරාතුව ද කොළඹ පරපුරේ කවීන් ජන කවියෙන් යම් ආලෝකයක් ලැබූ අවස්ථා හමුවන අයුරු අවධානයට ගත හැකි ය. පී. එච්. පෙරේරා රචනා කළ කුරක්කන් හේන, කේයස් ලියූ ධීවරී ගීතය එබඳු කාව්‍ය නිර්මාණ වේ. එහෙත් අමල් බිසෝ කාව්‍යය තරම් පැහැදිලි ව හා ප්‍රබල ව  ජන කවි ආභාසය සංලක්ෂණය කරන නූතන කාව්‍ය නිර්මාණයක් ඊට පෙර පැහැදිලි ව හඳුනාගත නොහේ. මහගම සේකරගේ සක්වා ලිහිණි අමල් බිසෝ වැනි ම කවි කතාවකියි අමරසේකර පවසතත් අමල් බිසෝ කවි කතාවට වඩාත් සමීප වන්නේ සක්වා ලිහිණි කෘතියෙහි පැනෙන එනමින් යුතු නිර්මාණය නොව කිඳුරු කුමාරිගේ කතාව කවිපෙළ බව පැහැදිලි කරුණකි. අමල් බිසෝ හා කිඳුරු කුමාරිගෙ කතාව යන නිර්මාණ ද්වයට ම පාදක වන්නේ එක හා සමාන කතා වස්තුවකි.

[11] අමරසේකර, ගුණදාස, (1993). අමල් බිසෝ. (තෙවන මුද්‍රණය). කොට්ටාව, සාර ප්‍රකාශන. 09.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

එහෙත් ඒ ඒ කවියාගේ රීතියට අනුව කාව්‍ය නිර්මාණ ද්වයෙහි භාෂාව, කාව්‍යෝක්ති, ආකෘතිය හා ජීවන දෘෂ්ටියෙහි විවිධත්වයක් ප්‍රදර්ශනය කෙරෙන අයුරු මෙහිලා අවධානයට ගත හැකි ය.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙහිලා මුඛ්‍ය අවධානය අමරසේකරගේ අමල් බිසෝ (1960) හා මහගම සේකරගේ සක්වාලිහිණි (1962) යන කෘතීන්හි අන්තර්ගත පද්‍ය නිර්මාණ ද්වයක් කෙරෙහි යොමු කෙරෙන හෙයින් ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ යථෝක්ත කාව්‍ය ග්‍රන්ථ ද්විත්වයයි. ඒ හැරුණු විට අදාළ පරිදි යථෝක්ත කවීන් දෙදෙනාගේ වෙනත් කාව්‍ය කෘතීන් ද උපස්තම්භක කරගැනේ. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් අමරසේකරගේ හා සේකරගේ කාව්‍ය නිර්මාණ ආශ්‍රයෙන් ලියවුණු විචාර ග්‍රන්ථ, සඟරා හා පුවත්පත් ලිපි මෙන් ම අන්තර්ජාල පරිශීලන දැක්විය හැකි ය. ඒ අනුව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරුණු බව කිව හැකි ය.

## 4. සාකච්ඡාව හා ප්‍රතිඵල

අමල් බිසෝ කාව්‍යය නිර්මාණය සඳහා වස්තු විෂය වී ඇත්තේ ජනශ්‍රැතියෙහි හමුවන ප්‍රකට ජනකතාවකි. තත් ජනකතාව සමතික්‍රමණය කරමින් අමරසේකර ඒ පුවතට නවමු අර්ථකථනයක් ලබා දීමට උත්සාහ කරයි. පේරාදෙණි ගුරුකුලයට අයත් නිසඳැස් කවීන් එලියට්, පවුන්ඩ් යනාදි කවීන් අනුව යාම හේතුවෙන් ගොඩනැඟුවේ ඉංග්‍රීසි භාවිතය මත පදනම් වූ කෘත්‍රිම රූපක බවත්, ඒ අතර අමරසේකර සිංහල ජනකවිය කෙරෙහි නැඹුරු වෙමින් කාව්‍ය සම්ප්‍රදායක් ගොඩනැඟීමට වෑයම් කළ බවත් විමල් දිසානායකගේ ද අවධානයට ලක් ව තිබේ.[12] අමරසේකර අමල්බිසෝ කතා පුවත උපයෝගී කරගනු ලබන්නේ පාරිශුද්ධත්වය අහිමි ව වැලපෙන විමලා නමැති තරුණියගේ වරද සාමාන්‍ය මිනිස් ස්වභාවයක් බව කියාපෑමට ය. මෙහි දී ඔහු මතුකරන ප්‍රස්තුතය ලාංකේය සමාජ සංස්කෘතික පදනම සමග ඓන්ද්‍රිය ලෙස ප්‍රතිබද්ධ ව පවතී. සිංහල ග්‍රාමීය සමාජ පසුබිම අතුරෙහි නිරන්තරයෙන් ථෙරවාදී බෞද්ධ ඉගැන්වීම් සිහිකැඳවෙන නමුත් යුවතියකගේ පාරිශුද්ධත්වය අහිමි වීම සමාව භජනය කළ නොහැකි තරමට දරුණු වූවක් ලෙස සලකන බව පෙනේ. කවියා එම ප්‍රස්තුතය ලෞකික දිවිපෙවෙතේ සෞන්දර්ය හා ප්‍රකෘති ආවේගයන්හි මැඩලිය නොහැකි බව කුළුගැන්වෙන අයුරින් නිරූපණය කරයි. "අමරසේකර තම චින්තනය තුළ වෛෂයික ලෝකය කෙරෙහි ආශාව ප්‍රහීන කරමින් ඉන් එතෙර වීමට තැනත් දෙතොත් ඒ මඳ වශයෙනි. ඒ වෙනුවට ග්‍රාමීය සිංහල බෞද්ධ සුළුධනේශ්වරයෙහි සාමාජිකයකු හැටියට තමන්ට ඇති ආර්ථික, සාමාජික හා සංස්කෘතික ප්‍රශ්න තම චින්තනය හරි මැදට ගෙන එයි."[13] අමරසේකර ප්‍රබල සමාජ සංස්කෘතික ප්‍රස්තුතයක් පිළිබඳ සාකච්ඡා කරන නමුත් ස්වකීය කාව්‍ය නිර්මාණයෙහි පදනම කාල්පනික පසුතලයක් මත පිහිටුවීමට වෑයම් කරන බව පසක් වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

[12] Dissanayake, Wimal, (2005). Enabiling Traditions: Four Sinhala Cultural Intelelctuals. Boralesgamuwa, Visidunu Publications. 113.

[13] විජේගුනසිංහ, පියසීලි, (2005). නූතන සිංහල සාහිත්‍ය විචාරය - මාක්ස්වාදී අධ්‍යයනයක්. (දෙවන මුද්‍රණය) කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 172.

තව දුරටත් දිසානායක පවසන්නේ අමල්බිසෝ කාව්‍ය ග්‍රන්ථයෙහි එක් එක් කවියෙන් අමරසේකර, ජනකවි ආකෘතිය භාවිත කරමින් තත්කාලීන දැනවීම් හා හැඟීම් පිළිබඳ ව්‍යුහයක් සම්ප්‍රේෂණය කළ බවයි.[14] විශේෂයෙන් ම තත් කාව්‍ය නිර්මාණයේ පැනෙන හිමව් පියස, රකුස් පුරය, හසගනන්, සුවඳ සඳුන්, රන් විමන යනාදි සංකල්ප ඇසුරින් කවි සමයානුගත මුහුණුවර තිව්‍ර කොට තථ්‍ය ලොව කෙරෙන් දුරස්ථ කෙරෙයි. එහෙත් මෙහිලා ප්‍රතිනිර්මාණය වන්නේ තත්කාලීන නූතන සමාජ අනුභූතියකි. අමරසේකර මෙය නිරායාසයෙන් සිදු කරන්නක් නොවන බව ලියනගේ අමරකීර්ති "නවකතාවාදීත්වය සහ සිංහල කවියේ අර්බුදය" යන මැයෙන් යුතු පුවත්පත් ලිපියෙහි දක්වන අදහස් ඇසුරින් හඳුනාගත හැකිය.

"සිංහල කාව්‍යයෙහි එක් දුර්වලතාවයක් ලෙස ඔහු දකින කාව්‍ය අනවශ්‍ය ලෙස තථ්‍ය, ඓතිහාසික යථාර්ථය සමග සමගාමී ඒ හා බද්ධ වූ නිර්මාණ වීම ලෙස අමරසේකර මහතා මතු කරන තර්කයේ ඇත්තක් තියෙනවා. අමරසේකර මහතා මේ සඳහා යෝජනා කාව්‍ය කාල්පනික නිර්මාණ කළ යුතු බවයි. කාල්පනික නිර්මාණ සඳහා අප යොදාගන්නේ සංස්කෘතික සාහිත්‍යික ස්මෘතිය හා බැඳී වෙළී පවත්නා පැරණි වෘත්තාන්ත, ජාතක කතා හා ජන කතා ආදියයි යනුවෙන් ඒ මහතා ඊළඟට කියනවා"[15]

අමරසේකර අමල් බිසෝ කාව්‍ය නිර්මාණය මඟින් මෙම ලක්ෂණය ප්‍රබල ව විශද කරන අතර ඒ හා සාපේක්ෂව බැලූ කල සේකර ලියූ කිඳුරු කුමාරිගේ කතාව වෙනස් මුහුණුවරක් සංලක්ෂණය කරයි. කිඳුරු කුමාරිගේ කතාවෙහි වස්තු විෂය ජනශ්‍රැතිය යම් පමණකින් මූලාශ්‍රය කරගනිමින් නිර්මාණය කරන ලද්දකි. කිඳුරු විමන, කිඳුරු කුමරිය හා යකිනිය යනාදි වශයෙන් කාල්පනික මුහුණුවර ගොඩනඟන සංකල්ප එහිලා හමුවුව ද සේකර කාල්පනිකත්වය තථ්‍ය ලෝකය සමග සම්බන්ධ කරයි. කිඳුරු කුමරිය සමග ප්‍රේමයෙන් බැඳෙන්නේ මිනිස් කුමරුවෙකි. එහෙත් අමල්බිසෝ ග්‍රහණය කරගන්නේ රකුසෙකි. අමරසේකර සමස්ත අමල් බිසෝ කතාව ම කාල්පනිකත්වයෙන් අනූන ව නිර්මාණය කරන අතර අවසානයේ දී එය විමලාගේ වරද නිරවද්‍ය බව සනාථ කිරීමට යොදාගනී. අමල් බිසෝ මෙන් ම කිඳුරු කුමරිය ද යොවුන් වියට පත්වත් ම ගින්නෙන් දැවෙයි. කවීන් දෙදෙනා ම ගින්නෙන් සංකේතාර්ථයෙන් රාග අග්නිය අර්ථවත් කරන බව පෙනේ. අමරසේකරගේ කාව්‍ය නිර්මාණය මුළුල්ලේ ම ගින්නේ ප්‍රබලත්වය තියුණු ලෙස අවධාරණය කෙරේ. ගිනි නැඟෙන කේන්ද්‍රස්ථානය වන්නේ රකුස් පුරයයි. ගිනි නැඟෙන්නේ රකුසන්ගේ ගතිනි. සියුමැලි අමල් බිසෝ එම ගින්නෙහි ගොදුරක් වේ.

"අහස පළා ගෙන නඟිනා
දෙරණ පළා ගෙන නඟිනා
දසත දිගත විහිදු වනා
එගිනි කඳින් පුර දිලෙනා"[16]

[14] Enabiling Traditions: Four Sinhala Cultural Intelelctuals,113.
[15] සිළුමිණ. පුන්කලස. (2006-04-02) iii.
[16] අමල් බිසෝ, 49.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

හිමව් පියස සුවඳ සඳුන් රන් විමනක තබා නොයෙක් උපදෙස් ලබා දුන් නමුත් අමල් බිසෝ ප්‍රකෘති ආවේගයන්ගෙන් මිදීමට නොහැකි තත්ත්වයට පත්වෙයි. කවියා එගින්නේ ආකර්ෂණය හා තියුණු ක්‍රියාකාරීත්වය යළි යළි ඉස්මතු කරන්නේ ජනකවියෙහි පැනෙන අලංකරණ විධියක් වූ පුනරුක්තිය ද උපස්තම්භක කර ගනිමිනි. ඒ හා සාපේක්ෂ ව බැලූ කල සේකර රාගාග්නියේ දීප්තිය හා දැවීම නිර්මාණය කරන්නේ එතරම් තියුණු අයුරින් නොවේ. අමරසේකර ලෞකික ආරම්මණයන්හි බලපරාක්‍රමය අවධාරණය කරන විට සේකර ලෝකෝත්තර පසුබිමක රඳා හිඳිමින් දිවිය වෙළා ගත් අනිත්‍යතාව පිළිබඳ ගම්‍ය කරන සෙයකි.

"ලොවේ හැම සතට උරුමයි මේ ගින්න
නොවේ කිසිවකුත් ඒ ගැන නොම දන්න
බවේ සරන සත ඒ ගිනි මැද ඉන්න
දැවේ නිතින් නොහැකි ව ඉන් වළකින්න"[17]

ගින්නෙන් මුදනු වස් අමල් බිසෝ රඳවා ඇත්තේ හිමව් පියස රන් විමනක ය. කිඳුරු කුමරිය සිටින්නේ සයුර යට රිදී කුළක් මුදුනේ ඇති රන් විමනක ය. ඔවුහු ක්‍රමයෙන් යොවුන් වියට පත්ව රූපශෝභාවෙන් ආඪ්‍ය වෙති.

"ගෝමර මල්පෙති බඳ වට ඉසුණා
රූබර සිහිනිඟ සිහිනි ව සැදුණා
ඈ පුළුලුකුල ද වට කොට සැදුණා
නාඹර තුනුවිල මල්පෙති වැටුණා"[18]

"දැල ළමැද අළු ගෝමර ඉසින ළඳා
බාල ළපටි අත් මාලා සලන ළඳා
ආල වඩන රූපෙන් මන බඳින ළඳා
කෝල සිතින් ඇස ලා වට බලන ළඳා"[19]

අමරසේකර මන දල්වෙන ගින්න හා සමගාමීව ඇය ගත ඇති වන විපර්යාසයන් ද චමත්කාරජනක ව ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා සමත් ය. එමෙන් ම ජනකවි සම්ප්‍රදායේ ආභාසය ද මනාව ධ්වනිත කෙරෙන පරිද්දෙන් කාව්‍යෝක්ති ගොඩනගා තිබේ. ගෝමර, නාඹර, අළු ගෝමර, අත් මාලා යනාදි යෙදුම් ඒ සඳහා මනා උදාහරණ වේ. අමල් බිසෝහි කේන්ද්‍රීය ධාරණාව වන්නේ ගින්නෙන් දැවීම මිනිසත් බවට හිමි වරදක් වන බවයි. කවියා අමල් බිසෝ කුමරියගේ රූපශ්‍රීය වර්ණනා කරන්නේ ද එම අර්ථය කුළුගැන්වෙන අයුරිනි. ඇගේ ගතේ ප්‍රබෝධය වනාහි යොවුන් වියේ උතුරායනසුලු ජීව ශක්තිය ද අඟවන්නකි. මෙහිලා අමරසේකර කාව්‍යෝක්ති ප්‍රතිනිර්මාණය කෙරෙන් ජනකවියේ ආභාසය ලබන නමුත් මිනිස් ප්‍රකෘති ආවේග නිර්මාණයෙහිලා ජීවන දෘෂ්ටිය කෙරෙන් වඩාත් නූතනවාදී මුහුණුවරක් විශද කරන ආකාරය කැපීපෙනේ.

[17] සේකර, මහගම, (2005). සක්වාලිහිණි. (තෙවන මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 37 පිට.
[18] අමල් බිසෝ, 50.
[19] සක්වාලිහිණි, 38.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

සම්ප්‍රදාය මත පිහිටා සිටිමන් ම ඔහු ස්ථාපිත කිරීමට වෑයම් කරන්නේ යුවතියකගේ පාරිශුද්ධත්වය අහිමි වීම නොතකා හැරීම පිළිබඳ නූතන මතවාදයකි. "නූතනවාදය තුළ අද්‍යතන ජීවිතය, තත්කාලීන සමාජ හා සමකාලීන විඥානය කාව්‍යාත්මක ලෙස නිරූපණය කිරීමට ගත් උත්සාහය අතින් ඔහු ටී. ඇස්. එලියට්, ඩබ්ලියු. බී. යේට්ස් ආදී ඉංග්‍රීසි නූතනවාදී කවියන් හා සමතැන් ගනියි.[20] මේ හා සාපේක්ෂ ව බැලූ කල සේකර එබඳු කේන්ද්‍රීය අර්ථයක් ප්‍රබල ලෙස ගොඩනැඟීමට වෑයම් නොකරයි. ඔහු කිඳුරු කුමාරියගේ රූපශ්‍රීය වර්ණනා කරන්නේ ඇගේ යොවුන් රූපශ්‍රීය මතුනොව බොළඳ ළමා ස්වරූපය ද ඇගවෙන පරිද්දෙනි. මෙහිලා සේකරගේ කාව්‍ය සංකල්පනා තරමක් දුබල වීමට ඔහු භාවිත කරන කාව්‍ය ආකෘතිය ද බලපා ඇත. අමල් බිසෝ කාව්‍ය නිර්මාණයෙහිලා අමරසේකර අවස්ථෝචිත ව විරිත් වෙනස් කරයි. අමල් බිසෝගේ චෛතසික ස්වභාව, රකුසන්ගේ ක්‍රියාකාරීත්වය, ගින්නේ දැවෙනසුලු බව ආදිය තිව්‍ර ලෙස සූචනය කිරීමට උචිත ලෙස දිගු විරිත් හා කෙටි විරිත් පරිභාවිතය ඇසුරින් වඩාත් විචිත්‍ර ව කාව්‍යෝක්ති නිර්මාණය කර තිබෙනු දකිය හැකි ය. එහෙත් සේකර කිඳුරු කුමාරිගේ කතාවෙහිලා යොදාගන්නේ මාත්‍රා දහඅටකින් සමන්විත එක ම විරිතකි. ඒ අතර ම බොහෝ විට කව්වල මුල හා අග ආයාසයෙන් එළිසමය පිහිටුවීමට දරූ උත්සාහය ද අර්ථය ලිහිල් කිරීමට බලපෑ අවස්ථා බහුල ව දක්නට ලැබේ. "ආකෘතිය වූ කලී වස්තු විෂයෙහි තර්කානුකූල ප්‍රතිඵලයක් බව වටහා ගැනීම සේකර කවියකු වශයෙන් සාර්ථක වීමට තුඩුදුන් වැදගත් කරුණකි."[21] එහෙත් මෙම කවි පෙළෙහිලා සේකර, වස්තු විෂය ඔප්නැංවීමට ආකෘතිය ඖචිත්‍ය පූර්වක ව භාවිත කිරීමට අසමත් ය. අමරසේකර එම අභියෝගය සාර්ථකව ජයගනී.

අමල් බිසෝ ගින්නෙන් දැවෙන්නේ හුදු ප්‍රේමාන්විත බන්ධනයක ප්‍රතිඵලයක් ලෙස නොවේ. ඇ ගින්නෙන් වෙළී රකුසු හඬට දොර අරින්නී ය. දූෂිතවූ පව්වූ ලොව අතුරෙහි යුවතියකගේ පිවිතුරු බව රැකගැනීම ඉතා අසීරු කර්තව්‍යයක් බව අමරසේකරගේ නිර්මාණවල නිතින් හමුවන අදහසකි. අමල් බිසෝ කාව්‍යයෙහි ම හමුවන කතාපුවත කාව්‍ය නිර්මාණයෙහි ද මෙසේ පැවසේ.

"වසා ගත් පෙති තුළ මුවා කොට
ඒ අමා මකරන්ද බින්දුව
පළා බොන්නට මුව අයාගත්
නැද්ද රකුසෙක් තව ම මේ විල"[22]

සියුමැලි යුවතිය රකුසු ග්‍රහණයට හසුවීම හුදු රැවටීමක, අත්වැරදීමක හෝ ක්ෂණික ආවේගයක ප්‍රතිඵලයක් වන බව අමරසේකර පෙන්වා දෙයි. එහෙත් කිඳුරු කුමාරිය ගින්නෙන් දැවෙමින් මැදුරෙන් පිටවී ප්‍රේමාන්විත ග්‍රහණයකට හසුවන්නී ය. කිඳුරු කුමරිය මිනිස් කුමරකු සමඟ සැළමුතු පෙමින් බැඳේ. කුමරු කෙරෙන් රකුසු මුහුණුවරක් දිස් නොවන අතර ඔවුන් හමුවේ පවත්නා බාධකය වන්නේ කින්නර යෝනියේ කුමරියකට මිනිස් කුමරකු සමඟ එක් ව විසීම නොකළ හැකිවීම යි. ඔවුන්ගේ ගින්න නිවෙන්නේ මරණයෙන් පසු ව පමණි.

---

[20] ඉලයප්ආරච්චි, එරික්, (2005). විචාර පත්‍රිකා. (පළමු මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 26.

[21] කුමාරසිංහ, කුලතිලක, (2002). නූතන කාව්‍ය විමර්ශන ලේඛන - ද්විතීය භාගය. (පළමු මුද්‍රණය). කොළඹ 10 ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. 140.

[22] අමල් බිසෝ, 38.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

අවසානයේ ඔවුහු මරු සුවය පතති. බාධා විපත් දුරු කරනුව මරණය හැර අන්මගක් නැති බව කවියා අවධාරණය කරයි. මෙය සුබවාදී ජීවන දෘෂ්ටියක් නොවේ. එය වනාහි ජනකවි අතුරෙහි ද හමුවන "මොකද කරන්නේ පූරුවෙ කළ පවට" වැනි නිගමනයකි. එහෙත් අමරසේකර ඊට වෙනස් දෘෂ්ටියකින් මිනිසත් බවට හිමි වැරදි නොතකා හැරීම පිළිබඳ අදහසක් ඉස්මතු කරයි. එහි දී මිනිස් සත්ත්වයාට ප්‍රාකෘතික ලිංගික ආවේගවලින් මිදිය නොහැකි බව අවධාරණය කළ ලෝරන්ස්ගේ දෘෂ්ටිය ද මෙහි දී අමරසේකර කෙරෙහි බලපා ඇති බව පෙනෙයි. අමල් බිසෝ කවිපෙළ සම්බන්ධයෙන් වැදගත් නිරීක්ෂණයක් ඒ. එම්. ජී. සිරිමාන්න, 'ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකර නවකතා' නමැති ලිපියෙහි දක්වයි.

"අප මෙහි දී ඇසිය යුතු වැදගත් ප්‍රශ්නයකි. ඒ විමලාට වූ සිද්ධිය හා අමල් බිසෝ ගින්නෙන් දවීමයන කතුවරයාගේ අදහස කුමක්ද යනු යි. එය මිනිසත් බවට හිමි වරදක් වෙතැයි කතාකාරයා මුලදීම කියයි. එය වරදකැ යි කියන්නේ ඇයි? එය වරදක් බව පෙනෙන්නේ ථෙරවාද ඉගැන්වීම් හා වික්ටෝරියානු සමාජ සභ්‍යත්වය පිළිගත්තවුන්ටය."[23]

මේ පිළිබඳ ව තවදුරටත් විමසා බැලීමේ දී පෙනෙන්නේ කවි පෙළ ඇරඹුමේ දී විමලාගේ වරදෙහි නිරවද්‍යතාව ලොවට ඇසෙන සේ කියා පෑමට අදහස් කරන බව කීවත් අමරසේකර අමල් බිසෝ දොර හැරීම හා ගින්නෙන් දැවීම මහා විනාශයක් ලෙස නිරූපණය කර ඇති බව යි. එමගින් සංකේතාත්මක ව ඇඟවෙන්නේ ඇගේ පාරිශුද්ධිය අහිමි වීම බරපතළ වරදක් බවමැයි.

"නිදන් වසා සිටිය දොරා
තිදස් පුරේ රුවන් දොරා
ලෙවන් නුදුටු රුවන් දොරා
ඇ ඇරියේ එවන් දොරා

පිට පිට හෙණ හඬ විහිදිණ
මිහිකත සත් යළක් සැළිණ
සිරුර බිඳී ලේ වැගිරිණ
එගිනි මැදෙහි ඈ බිලිවිණ"[24]

මෙම තත්ත්වය පැහැදිලි ව වටහා ගැනීම සඳහා නැවතත් ලාංකේය නූතනත්වයේ යථා ස්වභාව පිළිබඳ ව අවධානය යොමු කළ යුතු වෙයි. මෙරට නූතනත්වය සමාජ පරිස්ථිතියේ සිදු වූ විපර්යාස හේතුවෙන් ඓන්ද්‍රීය වශයෙන් උත්පාද නොවූවක් බවත් එය යටත් විජිතවාදයේ අතුරු ඵලයක් බවත් පැහැදිලි කරුණකි. අමරසේකර පැවසීමට උත්සාහ කළ ප්‍රස්තුතයට පටහැනි අයුරින් තරුණියගේ පාරිශුද්ධිය අහිමි වීම ලොව ම කම්පා කරවන්නක් ලෙස නිරූපණය වී ඇත්තේ ද තවමත් මෙරට නොනැසී පවත්නා සාම්ප්‍රදායික සමාජ ප්‍රතිමානයන්හි බලපෑම යටතේ ය. නූතනවාදී ලේඛකයෝ වික්ටෝරියානු සුචරිතවාදය හෙළා දුටුවහ.

[23] සිරිමාන්න, ඒ.එම්.ජී. (2002).ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකර නවකතා. වීමංසා නවකතා අංකය. කොළඹ 10 ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 113.
[24] අමල් බිසෝ, 64.

එහි නියමුවා වශයෙන් හඳුනාගත හැකි ඩී.එච්. ලෝරන්ස්ගේ කෘතීන්ගේ ආභාසය ලබා ලිංගික ආවේග නොබිය ව පිළිගත යුතු බව අමරසේකර ද බොහෝ නිර්මාණයන්හි නිරූපණය කර ඇති නමුත් ලාංකේය සමාජ පුරුෂාර්ථ මුළුමනින් ම ප්‍රතික්ෂේප කිරීමට අපොහොසත් වූ අයුරු ද මේ අනුව හඳුනා ගත හැකි ය.

## 5. සමාලෝචනය

අමරසේකරගේ අමල්බිසෝ කාව්‍ය ග්‍රන්ථයෙහි පැනෙන අමල්බිසෝ යන මැයෙන් යුතු නිර්මාණය හා මහගම සේකරගේ සක්වාලිහිණි කෘතියෙහි පැනෙන කිඳුරු කුමාරිගේ කතාව කවි පෙළ පාදක කරමින් තත් කවීන් දෙදෙනා ජනකවියේ ආභාසය ලබන්නේ කවර ආකාරයෙන් ද යන්න මෙහිලා සාකච්ඡාවට බඳුන් කෙරිණි. එහි දී අමරසේකර වඩාත් නූතනවාදී ප්‍රවේශයකින් සාම්ප්‍රදායික අමල්බිසෝ කතාවේ අර්ථය නූතන අනුභූතියකට සම්බන්ධ කරන අයුරු සුවිශද විය. සේකර ස්වකීය කාව්‍ය නිර්මාණයට ජනකවියේ ආලෝකය ලබන්නේ අමරසේකර මෙන් රැඩිකල් ස්වරූපයකින් නොව සාම්ප්‍රදායික බෞද්ධ ජීවන පුරුෂාර්ථ මත මැනවින් රඳා සිටිමින් බව ගම්‍යමාන වේ. එමෙන් ම සමාජ, සංස්කෘතික පරිස්ථිතිය මත පදනම් ව අමරසේකරගේ එකී රැඩිකල් ස්වභාව වුව යම් සීමාවක සිරගත වන අයුරු ප්‍රදර්ශනය වේ. ඒ ආශ්‍රයෙන් තත් කවීන් දෙදෙනාගේ කාව්‍ය භාවිතයෙහි එක් පැතිකඩක් හඳුනාගත හැකි ය.

## 6. නිගමනය

සමස්තයක් වශයෙන් ගත් කල අමල් බිසෝ හා කිඳුරු කුමාරිගේ කතාව යන කාව්‍ය නිර්මාණ ද්වය ඇසුරින් සුප්‍රකට කවීන් දෙදෙනකුගේ කාව්‍ය භාවිතාව කෙරෙහි ජනකවිය බලපෑ අයුරු හඳුනාගත හැකි ය. එක ම ජනකවි සම්ප්‍රදායේ ආභාසය කවීන් දෙදෙනා කෙරෙහි බලපා ඇත්තේ විවිධත්වයක් සංලක්ෂණය කෙරෙන අයුරිනි. විශේෂයෙන් ඒ පසුබිමෙහි පවත්නේ අමරසේකරගේ හා සේකරගේ පෝෂණ අවකාශයේ විවිධත්වය, ජීවන දර්ශනයේ විෂමතාව හා කාව්‍ය ශිල්ප ධර්ම භාවිතයෙහි පළ කළ කුසලතාව යනාදියයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

අමරසේකර, ගුණදාස, (1993). අමල් බිසෝ. (තෙවන මුද්‍රණය). කොට්ටාව, සාර ප්‍රකාශන.

අමරසේකර, ගුණදාස, (2009). උයනක හිඳ ලියූ කවි. (තෙවන මුද්‍රණය). බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශන.

සේකර, මහගම, (2005). සක්වාලිහිණි. (තෙවන මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

**ද්විතීයික මූලාශ්‍රය**


ඉලයප්ආරච්චි, එරික්, (2005). විචාර පත්‍රිකා. (පළමු මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරසිංහ, කුලතිලක, (2002). නූතන කාව්‍ය විමර්ශන ලේඛන, ද්විතීය භාගය. (පළමු මුද්‍රණය). කොළඹ 10 ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දනන්සූරිය, ජිනදාස, (2005). කලාත්මක පරිකල්පනය, කාව්‍ය විචාර චින්තා, (පළමු මුද්‍රණය). කොළඹ 10. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේගුනසිංහ, පියසීලි, (2005). නූතන සිංහල සාහිත්‍ය විචාරය, මාක්ස්වාදී අධ්‍යයනයක්. (දෙවන මුද්‍රණය) කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිමාන්න, ඒ.එම්.පී. (2002).ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකර නවකතා. වීමංසා නවකතා අංකය. කොළඹ 10 ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. සිළුමිණ. පුන්කලස. (2006-04-02) iii පිට.


## References


Dissanayake, Wimal, (2005). Enabiling Traditions: Four Sinhala Cultural Intelelctuals. Boralesgamuwa, Visidunu Publications.

Obeysekara, Ranjini, (1974) Sinhala Writing and the New Critics. Colombo, M. D. Gunasena.


JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

# සිංහල භාෂාවේ හල් ලකුණ හා හල් පිල්ල පිළිබඳ විමර්ශනයක්

# An Analysis of Hal Lakuna and Hal Pilla in Sinhala Language

*කේ.කේ.පී. පෙරේරා*

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28


## Abstract

Modern Sinhala letters have been created as a result of a long history. However, current researchers and scholars of the Sinhala alphabet observe that they should be ‘revised’. They desire that the obsolete characters, low usage characters, and characters with similar pronunciations should be removed. Another suggestion is that some different types of ‘pillam’ in the alphabet should be equaled by usage. In this research, we focused on the ‘hal’ mark. Moreover, the research problem of this article was ‘what is the hull mark’ and ‘is it applied to all letters in the same pattern?’ The purpose of this research is to reduce problems in the usage of ‘hal’ marks. Accordingly, it will focus on the origin and evolution of the ‘hal’ mark. It examines how to use modern language. This research has been used in inscriptions from the 8th century to the 16th century AD. Upon engaging in this research we recognized how we can use the ‘hal’ mark as a ‘pillama’ when writing ‘ඒ’ and ‘ඕ’. We can also utilize the ‘hal’ mark as a pure consonant in all other cases; it is not a pillama bat it is a part of pure consonant. Two patterns of ‘hal’ marks due to a long development of the Sinhala letters were observed.


***Keywords:*** Pillam, ‘Hal’ Mark, Sinhala Alphabet

**සාරාංශය**

මෙම පර්යේෂණයේ දී අපගේ අවධානය යොමු වන්නේ සිංහල භාෂාවේ භාවිත පිලි රූපයක් වන හල් ලකුණ පිළිබඳවයි. හල් ලකුණ පර්යෂණයට නිසි වන්නේ එහි පවතින ගැටලු සහිත ස්වරූපය හේතුවෙනි. මෙම පර්යේෂණයේ ගැටලුව නම්, හල් ලකුණ යනු කුමක්ද, එය සෑම අක්ෂරයක් සමඟ ම සමාන ස්වරූපයෙන් යෙදෙන්නේ ද? යන්නයි. ඒ අනුව මෙහි අරමුණ වන්නේ හල් ලකුණ භාවිතයේ වූ ගැටලු ස්වරූපය මගහරවා ගැනීමයි. ඒ සඳහා හල් ලකුණේ ආරම්භය හා විකාසය විමසා බැලෙන අතර ක්‍රි.ව. 8වන සියවසේ සිට ක්‍රි.ව. 16වන සියවස තෙක් ශිලාලේඛන ඒ සඳහා යොදා ගැනේ. පසුව එය නූතන සිංහලයට ගැළපෙන්නේ කෙසේදැයි විමර්ශනය කෙරෙනු ඇත. පර්යේෂණය අවසානයේ අවබෝධ වූයේ හල් ලකුණ පිල්ලමක් ලෙස මෙන් ම ශුද්ධ ව්‍යඤ්ජනයක් ලෙස ද යෙදෙන බවයි. හල් ලකුණ '**ඒ**' සහ '**ඕ**' සමඟ යෙදීමේ දී පිලි රූපයක් ලෙසත් සෙසු සෑම අවස්ථාවක ම හල් ලකුණ යනු ශුද්ධ ව්‍යඤ්ජනය දැක්වීමේ ලකුණක් විනා පිලි රූපයක් නොවන බවත් පැහැදිලි විය.

*ප්‍රමුඛ පද* - පිල්ලම්, හල් ලකුණ, සිංහල අක්ෂර මාලාව

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

## 1. හැඳින්වීම

සිංහල භාෂාවේ පිලි යෙදීම සම්බන්ධ ගැටලු රැසකි. හල් කිරීම ද එවැන්නක් වන අතර හල්කිරීමේ ලකුණ භාෂාව තුළ යෙදෙන ස්වභාවය අනුව ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය. පළමු වැන්න ශුද්ධ ව්‍යඤ්ජනය දැක්වීමේ දී යොදන හල් ලකුණයි. දෙවැන්න ව්‍යඤ්ජනයකට ස්වරාක්ෂරයක් එක්වීමේ දී දීර්ඝත්වය පෙන්වීම සඳහා ඇතැම් අවස්ථාවල දී යොදන හල් ලකුණයි. මේ හේතුවෙන් හල් ලකුණ හුදු පිල්ලමක් ලෙස දැක්වීම සුදුසු නොවේ. එනිසා ම හල් කිරීම පිළිබඳ නූතන සිංහලයේ පැහැදිලි කියැවීමක් නොමැත. මෙම පර්යේෂණයෙන් සිදු කෙරෙන්නේ හල් ලකුණේ ආරම්භය හා විකාශනය සලකා බලා නූතනයේ එය භාවිත විය යුතු ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති කරවීමයි. ඒ සඳහා පළමු කොට පිලි යනු මොනවාද හල් ලකුණ පිලි ලෙස යෙදෙන්නේ කෙසේද හා ශුද්ධ ව්‍යඤ්ජනයක් ලෙස යෙදෙන්නේ කෙසේද යන්න විමසා බැලීමට නියමිතය.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, කෞතුකාගාර නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් තොරතුරු සපයා ගැනීම, *Epigraphia Zeylanica Vol I, II, III, IV, V ,VI, VII*, *Inscription of Ceylon Vol I,II,V, VI, VII, VIII* ග්‍රන්ථ අධ්‍යයනය ආදිය ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත්, අනෙකුත් පර්යේෂණාත්මක ලිපි ලේඛන ද්විතීයික මූලාශ්‍රය ලෙසත්, තෘතීයික මූලාශ්‍රය වශයෙන් සඟරා, පුවත්පත් හා දේශන සටහන්, යනාදිය භාවිතයට ගැනේ.

## 3. සාහිත්‍ය විමර්ශන

මෙම පර්යේෂණය සඳහා පාදක කොට ගත් මූලාශ්‍රය අතර අක්ෂර රූප විකාසය හා පිලි භාවිතය පිළිබඳ ප්‍රාමාණික පර්යේෂණ සිදු වී ඇතත් ඒ අතරින් බහුතරය ක්‍රි.පූ 3වන සියවසේ සිට ක්‍රි.ව. 10වන සියවස තෙක් ලියැවුණ ඒවා ය. පී.ඊ.ඊ ප්‍රනාන්දු, බ්‍රාහ්මී ලේඛනවල පුරාක්ෂර විද්‍යාත්මක සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක් කොට තිබේ. සද්ධාමංගල කරුණාරත්නගේ පර්යේෂණ නිබන්ධයක ද ( *Epigraphia Zeylanica vol vii special volume*) මුල් කාලීන අක්ෂර විකාසය සම්බන්ධ තොරතුරු දක්වා තිබේ. තෙන්නකෝන් විමලානන්දගේ **'ක්‍රි.ව. 10වන සියවස දක්වා ලංකාවේ අක්ෂර විද්‍යාව'** නම් පර්යේෂණ නිබන්ධය හා නන්දසේන මුදියන්සේගේ **'සිංහල අකුරුවල ඉතිහාසය'** ග්‍රන්ථයේ ක්‍රි.ව. 10වන සියවස තෙක් අක්ෂර පිළිබඳ අධ්‍යයනය කොට ඇත. ඊට අමතර ව ජයසිරි ලංකාගේ 'සිංහල වර්ණමාලාවේ විකාසය' ග්‍රන්ථයේ ක්‍රි.ව. 10වන සියවස තෙක් අක්ෂර රූප විකාසය පිළිබඳ කරුණු දක්වා ඇති අතර ක්‍රි.පූ. 3වන සියවසේ සිට ක්‍රි.ව. 10වන සියවස තෙක් අක්ෂර රූප විකාසය හා තත් කාල පරිච්ඡේදයෙහි සිංහල අක්ෂර කලාව කෙරෙහි භාරතයෙන් සිදු වූ බලපෑම පිළිබඳ ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමියන්ගේ 'සිංහල අක්ෂර රූප විකාසය හා භාරතීය ආභාසය' ග්‍රන්ථයෙන් ප්‍රාමාණික විග්‍රහයක් සිදු කොට තිබේ. තව ද *Epigraphia Zeylanica*, yd *Inscriptions of Ceylon* කාණ්ඩ ග්‍රන්ථවල ද පුරාක්ෂර සම්බන්ධ තොරතුරු අන්තර්ගත වේ. කොත්මලේ අමරවංශ හිමියන්ගේ 'ලක්දිව සෙල්ලිපි' (ග්‍රන්ථයේ ප්‍රස්ථාවනාව) 'ලේඛන කලාවේ ආරම්භය හා විකාසය' මැයෙන් අක්ෂර පරිණාමය පිළිබඳ තොරතුරු අන්තර්ගත ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 20

ඉහත දක්වා ඇති පර්යේෂණවල අක්ෂර පරිණාමය යටතේ පිලි භාවිතය පිළිබඳව ද තොරතුරු ඇතුළත් වුවත් කේවල අධ්‍යයනයක් සිදු වී නොමැත. එමෙන්ම ක්‍රි.ව. 10වන සියවසේ සිට 15වන සියවස දක්වා පර්යේෂණ සිදු වී ඇත්තේ අල්ප වශයෙන් බැවින් හල් ලකුණ භාවිතයට පැමිණෙන්නේ ද ක්‍රි.ව. 8 වන සියවසෙන් පසු ක්‍රි.ව. 16වන සියවස දක්වා වීම හේතුවෙන් හල් සංකේතය පිළිබඳ සිදු වී ඇති පර්යේෂණ අවම ය. පී.ඊ.ඊ ප්‍රනාන්දු *University of Ceylon Review vol viii* හි පළ කළ ලිපියක ක්‍රි.ව. 8 වන සියවසේ සිට 15වන සියවස දක්වා අක්ෂර රූප විකාසය හා පිලි යෙදුම පිළිබඳ අදහස් දක්වා ඇතත් එහි කේවල විග්‍රහයක් ඇතුළත් නොවේ.

## 4. සාකච්ඡාව

### පිලි යනු මොනවාද?

**හල් ලකුණ** පිළිබඳ දහස් දක්වන ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන,

> ශුද්ධ ගාත්‍රාක්ෂරයෙක් වූ කලී හල් යනුවෙන් කියනු ලැබේ. ක්, ග්, ට්. ත් යනාදීහු හල් වර්ණයෙනයෝ වෙත්. හල් යනු පාණිනීය ව්‍යාකරණයෙහි තබන ලද නාමයකි. සියබසෙහි වනාහි හල් භාවයෙහි සංඥාව නම් අක්ෂරයෙන් ඔසවන ලද කොඩියකට සමාන වූ රේඛා ලක්ෂණයක් හෝ අක්ෂරය මතුයෙහි පිහිටුවන ලද හිස් පළඳනාවකට සමාන වූ රේඛා ලක්ෂණයක් හෝ වෙයි. මෙයින් පළමු කී ලක්ෂණය පිණිස කොඩි ගසට සමාන වූ සෘජු රේඛාවක් අක්ෂරාන්තයෙහි සිට උඩට අදිනු ලැබේ. ඒ වනාහි අක්ෂරාන්තය දක්ෂිණාවෘත්ත වූ කල්හි ය. අක්ෂරය වාමාවෘත්ත වූ කල්හි දෙවනුව කී ලක්ෂණ යොදනු ලැබෙයි. (ගුණවර්ධන,1959:78)

යනුවෙන් දක්වයි. එමෙන් ම හෙතෙම දක්වන්නෙ මෙම අක්ෂර දක්ෂිණ ජම්බුද්වීපයේ උත්පත්ති ස්ථාන කොට ගත් බවයි. මේ ආකාරයට ගාත්‍රාක්ෂරයක ප්‍රකෘති ලක්ෂණය දැක්වීම පිණිස කිසියම් සලකුණක් අවශ්‍ය නොවුණත් අනෙකුත් සියලු ම ස්වර ගාත්‍රාක්ෂරය කෙරෙහි ආරූඪ කරන කල්හි විශේෂ ක්‍රමයක් අනුගමනය කළ යුතු අතර ම **පිලි යැයි හඳුන්වන්නේ එම ක්‍රමය** බව ගුණවර්ධනගේ අදහසයි.

> මේ ක්‍රමය නම් ගාත්‍රාක්ෂරය හා සම්බන්ධයෙන් ස්වරය ලිවීම නොවේ. ස්වරය වෙනුවෙන් එක් සංඥාවක් ගාත්‍රාක්ෂරය කෙරෙහි යෙදීම වේ. (ගුණවර්ධන,1959:79)

පිලි සම්බන්ධයෙන් කමාරතුංග මුනිදාස මතය, **ව්‍යාංජනය හා එක්වූ ස්වර ලිවීමේ ලා දක්වන ක්‍රමය පිලි** බවයි. (කුමාරතුංග,1963: 8.) **පිලි** පිළිබඳ අදහස් දක්වන මාතලේ සාසනතිලක හිමිට අනුව

> ස්වරයක් ව්‍යංජනාරූඪ වීමේ දී ස්වරය ඇති බවට යොදන ලකුණු පිලි වෙයි.

උන්වහන්සේ පිලි යන වචනය සඳහා මූර්ධජ 'ළ' භාවිත කිරීම ද විශේෂයකි. පිලි යන්නට විවරණ සපයන ශ්‍රීනාත් ගණේවත්ත පවසන්නේ,

> අක්ෂරවල දීර්ඝ හ්‍රස්ව ආදි භේද ද අක්ෂර සංයෝජනය ද ලේඛනය කොට දැක්වීම පිණිස එක්තරා ලකුණු විශේෂයක් අක්ෂර සමඟ යොදනු ලැබේ. මේ ලකුණුවලින් වැඩි කොටසක් හඳුන්වනුයේ පිලි හෙවත් පිල්ලම් යන නමිනි. (ගණේවත්ත,2003:37)

මෙහි දී **පිලි** යනු ස්වර සංකේත ම වශයෙන් නොදක්වා නව අර්ථයක් ලබා දී තිබේ. එහෙත් **මේ ලකුණුවලින් වැඩි කොටසක් හඳුන්වනුයේ පිලි හෙවත් පිල්ලම් යන නමිනි** යනුවෙන් දැක්වීමෙන් පැහැදිලි වන්නේ පිලි නම භාවිත නොකරන සලකුණු ද ඇති බවට දක්වන්නා වූ අදහසයි. සුචරිත ගම්ලත් ද **පිලි, පිල්ලම** ආදි නම් නිර්දේශ කරමින් අර්ථ සපයා ඇතත් එහිලා සාම්ප්‍රදායික මතය මිස අන් යමක් පවසා නැත. **පිලි** ලෙස අර්ථ දැක්වීමෙහිලා වෙනසක් නොකළ ද රේඵය, රකාරාංශය ආදි ඇතැම් ව්‍යංජන සංකේත ද **පිලි** ලෙස දක්වා ඇත. **පිලි** යන්නට තවත් විවරණ සපයන්නකු ලෙස ජේ. බී. දිසානායක පවසන්නේ, එය ප්‍රධාන කොටස් දෙකක් අනුව වර්ග වන බවයි. එමෙන් ම ප්‍රාණාක්ෂර හා පිලි අතර වූ සබඳතාවක් ද මතු කරයි. ප්‍රාණාක්ෂරය යනු ස්වර ශබ්ද නිරූපණය කිරීම සඳහා යොදා ගන්නා අක්ෂර විශේෂයක් ලෙස දක්වන අතර එවැනි ස්වර ශබ්ද සිංහලයේ යෙදිය හැකි වන්නේ පාදයක මුල් ම ශබ්දය යෙදෙන විට පමණක් බවත් පදයෙහි වෙනත් තැනක ස්වර ශබ්ද යෙදේ නම් එතැන්හි එය දක්වන්නෙ වෙනත් ලකුණකින් බවත් දිසානායක පවසයි.

> ස්වර ශබ්ද නිරූපණය කිරීමට පදයක මුල හැර වෙනත් තැන්ක යෙදෙන ලකුණු හැඳින්වීම සඳහා පිලි යන නම යෙදේ. ගාත්‍රාක්ෂරයක ගැබ් වන ස්වරය ඉවත් කරනු පිණිස යෙදෙන අල් ලකුණ අල් පිලි නමින් ද ව්‍යංජන ශබ්දයක් වෙනුවට යොදන පිලි ව්‍යංජන පිලි නමින් ද හඳුන්වමු. කොඩිය හා රැහැන අල් පිලි අතරට ද යංශය, රකාරාංශය හා රේඵය දකාරාංශය ව්‍යංජන පිලි අතරට ද ගැනේ. (දිසානායක,1995:14)

යන ප්‍රකාශය අනුව සෙසු බොහෝ දෙනෙකු සඳහන් කළ මත හා සාපේක්ෂ ව දිසානායක දක්වන මතය වෙසෙස් අරුතකින් සිටියි. සෙසු බොහෝ දෙනා රකාරාංශය, රේඵය හා යංශය **පිලි** ගණයට ම ඇතුළත් කළත් නිර්වචනය හා එය නොසැසඳේ.

දිසානායකගේ මතය හැරුණු විට ඉහත තොරතුරුවලට අනුව පෙනීයන්නේ **පිලි** යනු ස්වර අක්ෂර සංකේතයක් දරන්නා වූ ද සෑම ගාත්‍රාක්ෂරයක් සමඟ ම යෙදෙන්නා වූ ද විශේෂ භාවිතයක් බවයි. එහෙත් හල් ලකුණ පිලි ලෙස ගත නොහැකිද'යි ගැටලුවක් මතු වේ. ස්වරයක් නියෝජනය කරන සලකුණ පිලි ලෙස ගත්හොත් හල් කිරීම පිල්ලක් ද යන වග ගැටලුවකි. එහෙත් ඇතැම් ස්වර නියෝජනය කරමින් හල් ලකුණ ද ක්‍රියාත්මක වන අවස්ථා දක්නට ලැබේ. නමුදු හල් කිරිම තනි ව යෙදුණු කල එය පිල්ලක් නොවේ. පිලි යන අර්ථය සමඟ විමසූ විට කේවල හල් ලකුණ ශුද්ධ ව්‍යඤ්ජනය දක්වන සංකේතය විනා පිල්ලමක් නොවන බව කිව යුතු ය. හල් කිරීමේ සලකුණ තවත් පිලි සංකේතයක් සමඟ යෙදෙන විට එය පිල්ලක් බවට පත් වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-20

බොහෝ වචනවල මධ්‍යයට ශුද්ධ ව්‍යංජන යෙදෙන බැවින් හල් කිරීම ආකාර දෙකකින් භාවිතයේ දක්නට ලැබේ. **ම් ච් බ්** සහ (රැහැන් සලකුණ) **ජ් න් ක්** (කොඩි සලකුණ) යනු එම ආකාර දෙකයි ඒ අනුව මතු දැක්වෙන්නේ ව්‍යඤ්ජන මාලාවට හල් අක්ෂරය එක් කිරීමේ දී දැකිය හැකි ස්වභාවයයි. හෙවත් සිංහලයේ ශුද්ධ ව්‍යඤ්ජනයේ ස්වරූපයයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| ක් | ඛ් | ග් | ඝ් | ඞ් | ඟ් |
| ච් | ඡ් | ජ් | ඣ් | ඤ් | ඦ් |
| ට් | ඨ් | ඩ් | ඪ් | ණ් | ඬ් |
| ත් | ථ් | ද් | ධ් | න් | ඳ් |
| ප් | ඵ් | බ් | භ් | ම් | ඹ් |
| ය් | ර් | ල් | ව් | | |
| ශ් | ෂ් | ස් | හ් | ළ් | ෆ් |

**1.2 රූපය**

හල් කිරීම පිලි රූපයක් ලෙස ක්‍රියාත්මක වන්නේ අවස්ථා දෙකක දී පමණි. එනම් කොම්බුව සහ හල් කිරීම **'ඒ'** ස්වරය දැක්වීමේ දී සහ කොම්බුව ඇලපිල්ල සහිත හල් කිරීමෙන් **ඕ ස්වරය** නියෝජනය කරන සංකේත පිලි ලෙස ගත හැකි වේ. පෙර දැක්වූ පරිදි පිලි යනු ස්වරාක්ෂරයක් ව්‍යඤ්ජනයකට එක් වීමේ දී ස්වරය නියෝජනය කරන්නා වූ සංකේතය බැවින් ව්‍යඤ්ජන අක්ෂරයකට තනිව යෙදෙන හල් ලකුණ පිල්ලමක් සේ නොගත යුතු ය.

නූතනයේ පිලි භාවිතය පිළිබඳ ප්‍රධාන මතයක් පලකරන අජිත් තිලකසේන, සුචරිත ගම්ලත් වැනි උගත්තු පිලි සමරූපීකරණය පිළිබඳ සමාජ කතිකාවක් ගොඩ නගන්නට උත්සාහ දරති. ඊට හේතුවන්නේ එක ම පිල්ලම විවිධ අක්ෂර සමග රූප කිහිපයකින් ක්‍රියා කිරීමයි. මෙලෙස පිලි සමරූපීකරණය ගෙන එන්නේ ස්වර පිල්ලම් හා හල් පිල්ලම් සඳහා වන අතර එක ම සංකේතය සෑම අක්ෂරයක් සමග ම භාවිත කළ හැකි වන පරිදි වෙන ම හෝඩියක් ද නිර්මාණය කොට තිබේ. (තිලකසේන,2002:55)

ස්වර

| | | | | | |
|---|---|---|---|---|---|
| උ | අා | අැ | අෑ | ඉ | ඊ |
| උ | උෟ | එ | ඒ | ඓ | ඔ |
| (ඔ) | ඕ | (ඕ) | ඖ | | |
| අ | අා | අැ | අෑ | | |

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

මාත්‍රාංශ

| | | | | | |
|---|---|---|---|---|---|
| . | ා | ැ | ෑ | ි | ී |
| ු | ූ | ෘ | ෙ | (ෙ) | ් |
| ෟ | ෳ | ◡ | | | |

ව්‍යංජන

| | | | | | |
|---|---|---|---|---|---|
| ඛ් | ඛ් | ග් | ස් | ං | ඟ් |
| ච් | ඡ් | ජ් | ඣ් | ඤ් | ඦ් |
| ට් | ඨ් | ඩ් | ඪ් | | ඬ් |
| ත් | ථ් | ද් | ධ් | න් | ඳ් |
| ප් | ඵ් | බ් | භ් | ම් | ඹ් |
| ය් | ර් | ල් | ව් | | |
| ශ් | ස් | හ් | | | හ් |
| ෆ් | ස් | | | | |

**1.2 රූපය**

එහෙත් අක්ෂර ස්ථානගත කිරීම් පිළිබඳ විද්‍යානුකූලභාවයට මෙම හෝඩිය කොතෙක් දුරට ගැළපේදැයි සොයා බැලිය යුතුය. එසේම භාෂාවක අක්ෂර පරිණාමයේ ස්වභාවික පිහිටීම් හුදෙක් පහසුව උදෙසා වෙනස් කිරීම කොතරම් සාර්ථකදැයි විමසා බැලිම ද කලයුතු ය.

ඉහත තොරතුරු සියල්ල විමසා බැලූ විට පැහැදිලි වන කරුණ නම් සිංහල භාෂාවේ ව්‍යඤ්ජනවලට යෙදෙන සංකේත සඳහා පිලි, පිල්ල, පිල්ලම් යන නම භාවිත වන බවයි. එය තව දුරටත් විග්‍රහ කරන්නේ නම්,

> **ශුද්ධ ගාත්‍රාක්ෂරයක් ස්වරයක් හා සංයෝග වීමේ දී යොදන සංකේත,**
>
> **ශුද්ධ ගාත්‍රාක්ෂරයක් ලෙස නොව තවත් පිලි රූපයක් ලෙස ඇතැම් ස්වර නියෝජනය කරන හල් සංකේතය,**

පිලි, පිල්ල, පිල්ලම් යන නම්වලින් හැඳින්විය හැකි ය. ශුද්ධ ව්‍යංජනය සංකේතවත් කරන හල් සංකේතය පිලි ලෙස නම් නොයෙදේ. එය ව්‍යඤ්ජනය ස්වභාවයෙන් ම යෙදෙන්නක් මිස වෙන ම සංකේතයක් ලෙස ගත නොහැකි ය. ඒ අනුව හල් කිරීම ප්‍රධාන කොටස් දෙකක් යටතේ සාකච්ඡා කළ හැකි වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

## දීර්සත්ව සලකුණ හෙවත් හල් පිල්ලේ ආරම්භය හා විකාසය

සිංහල භාෂාවේ පිලි සලකුණ ලෙස හල් ලකුණ පළමුව යෙදෙන්නේ **එ** අක්ෂරයේ දීර්ඝ ස්වරූපය සඳහන් කිරීමේ දී ය. ක්‍රි. ව. 10 වන සියවස දක්වා **ඒ** ස්වරයෙහි ව්‍යඤ්ජන සංයෝගයක් හඳුනාගත නොහැකි අතර ඕ ස්වරයේ ව්‍යඤ්ජනාරූඪ ස්වරූපය හමුවන්නේ තවත් සියවස් කිහිපයකට පසු ය. ඇතැම් ශිලා ලේඛනවල පෙළෙහි දීර්ඝ ඒ කාරයේ ව්‍යංජනාරූඪයක් දක්වා තිබුණ ද රූප එලකයේ ඇත්තේ හ්‍රස්ව 'එ'හි ව්‍යංජනාරූඪය යි. තවත් ශිලා ලේඛන කිහිපයක විවිධ ස්ථානවල යොදා ඇති 'ඒ'හි ව්‍යංජන සංයෝගය දෙයාකාරයකින් දක්නට ලැබේ. නිදසුනක් ලෙස බදුලු ටැම් ලිපියේ (E.Z. III, 1933: pl 5.) මේ අක්ෂරය යෙදූ 'වැලැක්මේ' යන්නෙහි එක් අවස්ථාවක **කොම්බුව** සමග **ම** අක්ෂරයට යොදන **හල් කිරීම** පැහැදිලි ව දක්නට ලැබුණත් තවත් ස්ථානයක එම වචනය ම යෙදී ඇත්තේ **කොම්බුව** හා **ම** අක්ෂරය පමණක් දක්වමිනි.

 **මේ**  **මේ**

එහෙත් 12 වන සියවසේ දී පැහැදිලි ව ම දැකගන්නට ලැබෙන කොම්බුව සහ හල්කිරීමේ පිලි ද්වය බහුල ව භාවිත වන්නට වූ බව සෙල්ලිපි විමර්ශනයේ දී පෙනේ. 13 වන සියවසේ තත්ත්වය ද ඊට සමාන ය.

 **සේ** (E.Z. II, 1929: pl 27)  **ගේ** (ශි.ලේ.ස IV, 2002: එලක9)

13 වන සියවසට අයත් කොට්ටන්ගේ ලිපියෙහි හමුවන 'ගේ' අක්ෂරය සඳහා යොදා ඇති හල් කිරීමෙහි සංකේතයේ පෙර යුගයට වඩා වර්ධනීය ස්වභාවයක් දක්නට ලැබීම ද විශේෂයකි.

සිංහලයේ භාවිත **'ඕ'** අක්ෂරයේ ව්‍යංජනාරූඪය ද කාලයාගේ ඇවෑමෙන් භාවිතයට පැමිණි බවක් දක්නට ලැබේ. ක්‍රි. ව. 8, 9, 10 සහ 11වන සියවස් තෙක් **'ඕ'** අක්ෂරයේ ව්‍යඤ්ජන සංයෝගයක් දක්නට ලැබුණේ නැත. පාලි, සංස්කෘතාදි මව් භාෂානුගත දීර්ඝ ඒ කාරයක් භාවිත නොකරන බැවින් **ඕ** ස්වරය හා ඒ ආශ්‍රිත භාවිතයන් සිංහලයට විශේෂ වූවක් සේ සැලකීම යෝග්‍ය යැයි සිතේ. අප සිතන පරිදි **ඕ** හි ව්‍යඤ්ජන සංයෝගය පළමු වරට දක්නට ලැබෙන්නේ 12 වන සියවසේ දී ය. 12 වන සියවසේ වුව ද මෙම අක්ෂරය ලේඛනගතවීමෙහිලා ප්‍රදර්ශනය කළේ දෙමුහුන් ස්වභාවයකි. විටෙක ශබ්දය දීර්ඝ වුවත් රූපය දීර්ඝ ව දක්නට නොලැබුණු අතර සියුම් අත්හදාබැලීම් ද ඒ අතර වූ බව හඳුනාගත හැකි ය. එමෙන් ම නූතනයේ අප භාවිත කරන දීර්ඝ එ කාර ව්‍යඤ්ජන සංයෝග සහිත බොහෝ පද හ්‍රස්ව ස්වරූපයෙන් ද දක්නට ලැබුණි.(E.Z. II, 1929: pl 13)

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

බොහෝ - බොහොජනයා 

ලෝභයෙන් - ලොභයෙන් 

වහන්සේවරුන් - වහන්සෙවරුන් 

කීර්ති නිශ්ශංකමල්ලගේ පුවරු ලිපියෙහි (E.Z. II, 1929: pl 23) වැඩි වශයෙන් යෙදෙන **ලෝ** කාරය යුගයේ වෙනත් අක්ෂර හා සමගාමී ව බැලූ විට විශේෂ ක්‍රමවේදයකින් දක්නට ලැබේ. එනම් දීර්ඝ කොට දක්වන **ඕ**කාර ව්‍යංජනාරූඪය සඳහා අක්ෂරයේ සාමාන්‍ය ස්වරූපයට කිසියම් වෙනසක් සිදු කිරීමයි.

 ලෝක

 ලෝකය

 ලෝභයෙන්

මෙහි දක්වෙන ආකාරයට ල අක්ෂරය එම ලිපියේ ම නිවැරදි ස්වභාවයෙන් හෙවත්  ස්වභාවයෙන් දක්වෙතත් ඕ කාරය සංයෝග වීමේ දී අක්ෂරය අවසානයේ යොදන ලද රේඛාවක් දිස් වේ. එය බොහෝ විට දක්නට ලැබෙන්නේ ද **ල්+ඔ** සංයෝගයේ දී පමණක් වුව ද එම ස්වරූපය හ්+ඕ සංයේගයේ දී ද දකගත හැකි ය.  (E.Z. II, 1929: pl 13) මෙම ලිපියේ පුරාක්ෂර කියැවූ විද්වතා වුව ද මෙහි වූ සෑම අක්ෂරයක් ම දක්වා ඇත්තේ ල්+ඔ සංයෝගයක් හෙවත් හ්‍රස්ව ස්වරූපයෙන් ය. ඇතැම් විට එය ලේඛකයා තම ලේඛනය ශෛලාරූඪ කිරීමේ දී දීර්ඝ ඕ කාරය දැක්වීම සඳහා භාවිත කළ උපක්‍රමයක් විය හැකි ය. එවැනි **ල්+ඕ** සංයෝග උතුරු දොරටුව ශිලා ලේඛනයේ (E.Z. II, 1929: pl 27) ද දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ ලේඛකයින් කිසියම් අත්හදාබැලීමක් කළා ද යන සැකයයි.

 ලෝකොප

 ලෝකයා

යනු ඒ සඳහා නිදසුන් වේ. පොළොන්නරුව ගල්පොත (E.Z. II, 1929: pl 20) විහාර හා ලීලාවතී රැජිනගේ ශිලා ලේඛනයෙහි (ශි.ලේ.ස.1,2000:එලක22) ද මේ ස්වරූපය දක්නට ලැබේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

 ලොවැස්සන්  ලොකෙකමාන

 ලොක  ලොවැඩ

ඒ අනුව පෙනෙන්නේ දීර්ඝ ඕ කාරය ව්‍යංජනරූඪ ව දක්වීමෙහිලා විමර්ශනාත්මක යුගය ක්‍රි. ව. 12 වන සියවස බවයි. මේ වන විටත් හල් කිරීම, ඇලපිල්ල හා කොම්බුව පරිපූර්ණත්වයට පත් වූවත් එය යොදාගැනීමෙහිලා ගල්වඩුවා දක්වූ මැලිකමක් හඳුනාගත හැකි ය.

13 වන සියවසේ දී 12 වන සියවසේ වූ අත්හදාබැලීම් වශයෙන් සැක පහළ කළ ස්වරූපය මැකී ගොස් අක්ෂරය සාමාන්‍ය තත්ත්නයට ම පත් ව තිබේ.  (ශි.ලේ.සIV,2002: එලක9) එහෙත් මෙහි විය යුත්තේ ල්+ඕ සංයෝගයකි.

දීර්ඝ ස්වර සිංහලයට පැමිණියේ ක්‍රි. ව 8 - 10 සියවස්වල දී වුවත් 13වන සියවස තෙක් බිහි ව ඇති කිසිදු ලිපියකින් **ඕ** අක්ෂරයෙහි ව්‍යංජන සංයෝගයක් දක්නට නොලැබුණු බව පෙනේ. බොහෝ ශිලා ලේඛනවල දීර්ඝ **ඕ** සහිත ශබ්ද තිබුණ ද රූපයේ කිසිදු වෙනසක් නොවූ බව රූප එලක අධ්‍යනයයේ දී හෙළි විය. ක්‍රි.ව. 14 වන සියවසෙන් හමුවන **ඕ** ස්වරයේ ව්‍යඤ්ජන සංයෝග කෙබඳුදැයි මීළඟට විමසා බැලේ. මෙම යුගයේ දී **ඕ** ස්වරය ව්‍යංජනාරූඪ ව දක්වීමේ දී කිසිදු පිලි රූපයක් එක් වූයේ නැති අයුරු නිදසුනක් මඟින් හඳුනා ගත හැකි ය.

**'බිසෝවැ'** යනුවෙන් ගඩොලාදෙණි ගිරි ලිපියේ එන වදන රූප එලකයේ දක්වෙන්නේ  (I.C.Vol.VIII,2007:pl,IX) **'බිසොවැ'** යනුවෙනි. එහෙත් Inscriptions of Ceylon හි දක්වෙන කිත්සිරිමෙවන් කැළණි විහාර ලිපියෙන් මඳක් වෙනස් රූපයක් හමු වේ.

 (I.C.Vol.VII,2014:118)

මෙය දීර්ඝ **ඕ** ස්වරයේ **හ**කාර සංයෝගයක් ලෙස ගත හැකි වුව ද **'බොහෝ'** යනුවෙන් දක්විය යුතු තැන ශිලාලේඛන පෙළෙහි ඇත්තේ **'බොහො'** යනුවෙනි. මෙම රූපයේ හල් කිරීම ලෙස අප දක්වන සංකේතය, යුගයේ සෙසු හල්කිරීමේ ලකුණු සමග සැසඳෙන්නේ නැති බැවින් මෙය ගල්වඩුවාගේ වැරදි කැපුමක් ද විය හැකි ය. යුගයේ සෙසු ලිපිවල දීර්ඝ **ඕ** අක්ෂරයේ ව්‍යඤ්ජනාරූ ස්වරූප හමු නොවුණු බැවින් නිශ්චිත නිගමනයකට පැමිණීමෙහිලා අපහසුතා පැන නැගේ.
ක්‍රි. ව. 15 වන සියවසේ රචනා වන බෙලිගල සන්නසේ පළමු වතාවට එමෙන් ම ඉතා පැහැදිලි ව **ක්+ඕ** සංයෝගයක් හමු වේ.

 කෝ (කැ.වා,2005:9)

මෙවැනි රූපයක් දැදිගම ලිපියෙන් ද සපයා ගත හැකි ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

මෙවැනි රූපයක් දූදිගම ලිපියෙන් ද සපයා ගත හැකි ය.

 බෝ (කෑ.වා,2005:17)

එහෙත් වහරක්ගොඩ ලිපිය වැනි තවත් ලේඛන කිහිපයක නැවතත් නිවැරදි ව පිලි පිහිටුවා නොමැති ආකාරය දක්නට ලැබේ. මෙය ඕකාරය පමණක් නොව දීර්ඝ ඉස්පිල්ල වැනි පිලි ද හ්‍රස්ව ආකාරයෙන් ලේඛනගත කොට තිබේ. බොහෝ ලිපි ලේඛනවලට මෙම ගැටලුව පැන නැගෙන බැවින් හඳුනාගත හැකි වන්නේ මෙය යුගාවේණික දුර්වලතාවක් බවයි. ඉන් අනතුරුව එළඹි යුගවල එනම් ක්‍රි. ව. 17, 18 සියවස්වල දීර්ඝ ඔ හා ව්‍යංජන සංයෝග දැකිය හැකි අතර ම ඒවා නූතන ස්වරූපයට ද පත් ව ඇති බැව් හඳුනාගත හැකිය.

 (ශි.ලේ.ස IV, 2002: එලක3)  (I.C.Vol IX, 2015 pl IX.)

එසේ වුව ද ඇතැම් ලිපිවල හල් කිරීම නොමැති ව වුව ද දීර්ඝ ඕ අක්ෂරයේ ව්‍යංජන සංයෝගය දක්වා තිබීම විශේෂත්වයකි. 16 වන සියවසට අයත් විජයබාහු රජුගේ ලිපිය මීට නිදසුනකි.

 (I.C.Vol.VIII,2007:9)

මේ අනුව පැහැදිලි වන්නේ මාතෘ භාෂානුගත ක්‍රමය අනුව යමින් ඒ සහ ඕ යෙදීම මුල් කාලීන ලේඛනවල දක්නට නොවුණත් ක්‍රි.ව 10වන සියවසින් පසු අක්ෂරවල සිදු වූ හුදෙකලා සංවර්ධනය මගින් දීර්ඝත්වය සලකුණු කිරීම සඳහා ක්‍රමයක් නිර්මාණය කොටගත් බවයි.

**ශුද්ධ ව්‍යඤ්ජනයෙහි වූ සලකුණ - හල් කිරීම භාවිතයේ ආරම්භය හා විකාසය**

හල් කිරීමේ ලකුණ පළමුවරට හමුවන්නේ ක්‍රි. ව. 8 වන සියවසේ දී ය. මින් පෙර හල් අක්ෂර හෙවත් ශුද්ධ ව්‍යංජන යෙදුණේ සංයුක්ත ව වීම හේතුවෙන් හල් කිරීමේ සලකුණ කෙසේ හෝ දක්නට නොවී ය. අක්ෂරයේ ඉහළ දකුණු පසට වන්නට අඳින ලද සිරස් රේඛාවකින් මෙම යුගයේ ශුද්ධ ව්‍යඤ්ජනය මෙන් ම සෙසු ස්වර නියෝනාත්මක සංකේතවල ද හල් කිරීම සඳහා යොදා ගැනිණි. පිලි ලෙස යෙදෙන හල් කිරීමේ රූප විකාසයට පත්වූයේ කෙසේද`යි හඳුනා ගැනීම සඳහා මෙම යුගය වැදගත් වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

 ද් (E.Z. III, 1933: pl 17)  න් (E.Z. III, 1933: pl 17)

ගැරඬිගල සෙල්ලිපියේ පූර්වෝක්තාකාරයේ අක්ෂර කිහිපයක් යෙදුණ ද සංස්කෘත ලිපිවල තවදුරටත් හල් කිරීමක් නොවූයේ අක්ෂර සංයුක්ත ව ම ලියූ බැවිනි. ක්‍රි. ව 9 වන සියවසේ ද එහි විකාසනයක් නොවූයෙන් පෙර පරිදි ම යෙදෙන්නට විය.

 න් (ශි.ලේ.ස IV, 2002: එලක18)  ර් (ශි.ලේ.ස IV, 2002: එලක5)

අනතුරුව එළඹි ක්‍රි.ව. 10, 11, 12 යන සියවස්තත්‍රයේ ම හල් පිල්ලෙහි ස්වභාවයෙහි වෙනසක් නොවේ. විටින් විට විකල්ප රූප දක්නට ලැබුණ ද ඒවා අදාළ ශිලා ලේඛනයට පමණක් සීමා විය.

10 සියවස  ප්  ත් (ශි.ලේ.ස.1,2000ඃඑලක24)  ක් (ශි.ලේ.ස.1,2000ඃඑලක8)  න් (ශි.ලේ.ස.1,2000ඃඑලක20)  ම් (E.Z. II, 1929: pl 8)

11 සියවස  ව්  ම් (E.Z. V, 1965: pl 20)

12 සියවස  ල් (ශි.ලේ.ස.1,2000ඃඑලක14-15)

ක්‍රි. ව. 13 වන සියවසේ කොට්ටන්ගේ ශිලාලිපියේ 2 කොටසින් හල් කිරීමේ පළමු සංවර්ධන අවස්ථා ව විද්‍යාමාන වේ.

 ස් (E.Z. II, 1929: pl 13)  ග් (ශි.ලේ.ස IV, 2002: එලක 9)

ඒ හැරුණු විට සමාස පදවල පවා සංයුක්ත ව සංස්කෘතයෙහි දක්වෙන අක්ෂර පැහැදිලි ව ම හල් ස්වභාවයෙන් දක්වා තිබේ. කොට්ටින්ගේ ගිරිලිපියෙහි පළමු කොටසින් මේ සඳහා නිදසුන් සායා ගත හැකි ය.

 (ශි.ලේ.ස IV, 2002: එලක 9)

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

**‘ශ්‍රීමහාසම්මතපරම්පරායෙන්’**යනු එම අර්ථයයි. ඒ අනුව හල්පිලි යෙදීමෙහි තවත් ගැටලුවක් පහළ වේ. එනම් අක්ෂරයේ අන්තය ඉහළ කෙළවරෙන් වන්නේ නම් කොඩිය හෙවත් හල් කිරීම නොව රැහැන භාවිත කෙරේ. සෙසු අක්ෂර සියල්ලට ම යොදන්නේ කොඩියයි. නූතන භාවිතය එසේ වුව ද ක්‍රි. ව. 13 වන සියවස දක්වා ම සෑම අක්ෂරයකට ම යොදා ඇත්තේ කොඩිය ම බව පෙනේ. ඉහත නිදසුනෙන් ද එය මැනවින් අවධාරණය වේ.

 (ශි.ලේ.ස IV, 2002: එලක 9)

ක්‍රි.ව. 14වන සියවස වන විටත් එක ම පිලි රූපය භාවිත කළ ද නූතනයේ දී හල් කිරීමේ සළකුණු වර්ග දෙකක් දක්නට ලැබේ. එහෙයින් කොඩි සලකුණ ලෙස හඳුන්වන ස්වරූපයේ පිල්ල ක්‍රි. ව. 13 වන විට නූතන ස්වරූපයට පත් ව තිබුණත් දෙවැන්න වූ රැහැන් සලකුණ භාවිතයේ තිබුණේ නැත. සියලු ම අක්ෂර සඳහා යෙදුණේ කොඩි සලකුණ පමණි. නූතනයේ රැහැන් සලකුණ යෙදෙන ව්‍යංජන අක්ෂර ලෙස **ඛ, ඞ, ච, ඣ, ට, ඩ, ඬ, ධ, බ, ම, ඹ, ව** යන අක්ෂර හඳුනාගත හැකි ය. එහෙත් ක්‍රි.ව. 14වන සියවසේ දී මෙවැනි අක්ෂර සඳහා ද යෙදුණේ කොඩි සලකුණයි. සාමාන්‍ය පරිදි ඉහත සෑම අක්ෂරයක් ම අවසන් වන්නේ ඉහළ වම් පසිනි. වම් පසින් අවසන් වීම නිසා ම අක්ෂර පරිණාමයේ දී රැහැන් සලකුණ යෙදුවේ යැයි සිතිය හැකි ය.

ක්‍රි.ව. 14 වන සියවස අයත් හල් පිලි අතර මතු දැක්වෙන නිදසුන් විමසුව මනාය. මෙහි දී විශේෂ අවධානය ඉහත අක්ෂර 12 උදෙසා ය. එයින් රූප විකාසය මැනවින් පැහැදිලි කිරීම උදෙසා **ම** අක්ෂරය යොදා ගැනීම යෝග්‍ය වේ. ඊට එක් හේතුවක් වන්නේ යුගයේ බහුල ව **ම් අක්ෂරය** යෙදී තිබීම යි.

 (E.Z. III, 1933: pl 27.)  (E.Z. III, 1933: pl 2)  (ශි.ලේ.ස IV, 2002: එලක27)

 (ශි.ලේ.ස IV, 2002: එලක17)  (ශි.ලේ.ස IV, 2002: එලක17)

 (කෑ.වා,2005:176)

 (I.C.Vol.VII,2014:118)  (I.C.Vol.VII,2014:pl IX)

 (කෑ.වා,2005:158)

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

ඉහත සඳහන් **මී** අක්ෂරවලින් වැඩි කොටසක් කොඩිය සහිත හල්කිරීම බව හඳුනාගත හැකි අතර ම අංපිටිය ලිපිය හා ගණේගොඩ සන්නසේ වූ **මී** අක්ෂරය විශේෂ ය. එහි වූයේ සංවර්ධනය වූ ස්වරූපයකි. ක්‍රි. ව. 15 වන සියවසට අයත් **මී අක්ෂරය** යෙදීමේ ස්වභාවය පහත පරිදි ය.

 (කෑ.වා,2005:165)  (කෑ.වා,2005:176)

 (I.C.Vol.VIII,2007:15)

15 වන සියවසේ දක්නට ලැබෙ සෑම ම අක්ෂරයක් සඳහා ම යෙදුණු හල් සලකුණු 14 වන සියවසට වඩා සංවර්ධනය වූ ස්වභාවයක් පෙන්නුම් කරන අතර ම හල් කිරීමේ දී කොඩි සළකුණට වඩා වෙනස් වූ ස්වරූපයකින් පෙනී සිටී මෙම ස්වභාවය සෙසු අක්ෂර 11 කෙරෙහි ද බල පෑ ආකාරය දක්නට ලැබෙන අතර ඒ, ඕ ස්වර ඉහත දක් වූ **බ, ඞ, ච, ඣ, ට, ඩ, ඬ, ධ, බ, ම, ඹ, ව** යන ව්‍යඤ්ජන අක්ෂර 12 සමග සංයෝග වීමේ දී ද මෙම විශේෂත්වය දක්නට හැකි විය.

ක්‍රි. ව. 16 වන සියවසට අයත් දෙවුන්දර දේවාල සන්නසේ වූ විශේෂ **මී කාර** යෙදීම මැනවින් අධ්‍යයනය කිරීමෙන් පෙනීයන්නේ අක්ෂරාන්තය ඉහළ වම්පසින් වූ කල හල් ලකුණ යෙදීමේ වේගවත් භාවය හේතුවෙන් ද තල පත්වල ලිවීමේ දී හා සන්නස් රචනයේ දී එකී වේගය වැදගත් බැවින් ද කොඩි සලකුණෙහි ම තවත් දිගුවක් ලෙස රැහැන් ලකුණ සිංහල පිළි අතරට එක් වූ බවයි.

  (කෑ.වා,2005:182)

## 5. පර්යේෂණ ප්‍රතිඵල

පූර්වෝක්ත අධ්‍යයනයන් මත පෙනී යන්නේ හල් කිරීම ප්‍රධාන ක්‍රම දෙකක් අනුව වර්ග කළ හැකි බවයි ශුද්ධ ව්‍යඤ්ජනයක් ලෙස පවතින සෑම අක්ෂරයක ම හල් ස්වරූපය පවතින බව සහ **ඒ** සහ **ඕ** යන ස්වර ව්‍යඤ්ජනාරූඪ වන විට තවත් පිල්ලමක් හෝ කිහිපයක් සමග හල් ලකුණ යෙදෙන බව හඳුනාගත හැකි අතර ම හල් කිරීම පිළි රූපයක් වන්නේ ඒ සහ ඕ ස්වර ව්‍යඤ්ජන හා සංයෝග වීමේ දී පමණි.

එමෙන් ම හල් ලකුණ ශුද්ධ ව්‍යඤ්ජනයක් ඇඟවීමේ දී හෝ ස්වර ව්‍යඤ්ජනාරූඪ වීමකදී යන කවර ලෙසකින් පැවතිය ද අක්ෂරවල හැඩය අනුව ද හල් ලකුණේ ස්වරූප දෙකකි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

ඒ අනුව **බ, ඞ, ච, ඣ, ට, ඪ, ඬ, ධ, බ, ම, ඹ, ව** යන අක්ෂර සඳහා යෙදෙන්නේ රැහැන් සලකුණ වන අතර සෙසු සෑම ව්‍යඤ්ජන අක්ෂරයක් සඳහා ම කොඩි සලකුණ යෙදේ. ක්‍රි.ව. 14වන සියවස තෙක් සෑම අක්ෂරයක් සඳහාම යෙදුණේ කොඩි සලකුණ පමණක් වුව ද අක්ෂර ලිවීමේ හා විකාසනයේ ස්වභාවික ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 15වන සියවසේ දී හල් කිරීම ස්වරූප දෙකකට වෙන් විය. එනම් රැහැන සහ කොඩිය වශයෙනි. එයට හේතු වූ ප්‍රධාන සාධක කිහිපයකි.

**අක්ෂරාන්තය ඉහළ දකුණු කෙළවර ඇති විට-** මෙවැනි අක්ෂරවල පන්හිඳ එසවීමකින් තොර ව කොඩි සලකුණ දැමිය හැකි වූ බැවින් කොඩි සලකුණ වෙනස් නොවීම.

**අක්ෂරාන්තය දකුණුපස පහළ කෙළවර ඇති විට** - මෙවැනි අක්ෂරවල පන්හිඳ ඔසවා වක්‍රාකාර පෘෂ්ටය මත කොඩි සලකුණ යෙදූ බැවින් එහිලා වෙනසක් සිදු කළ නොහැකියාව මත කොඩි සලකුණ වෙනස් නොවීම.

**අක්ෂරාන්තය ඉහළ වම් කෙළවර ඇති විට** - කොඩි සලකුණ යොදන්නේ අක්ෂරයේ ඉහළ දකුණු පස බැවින් මෙවැනි අක්ෂර රචනයේ දී පන්හිඳ එසවීමට සිදු වේ. එය වේගයට බාධාවකි. ඒ සඳහා විකල්පයක් ලෙස පන්හිඳ අක්ෂරාන්තයේ සිට ආපසු දකුණුපසට ගෙන එයින් ඉහළට කොඩි සලකුණ යොදා තිබේ. දෙවුන්දර දේවාල සන්නස මීට කදිම නිදසුනකි. එය කලක් ගතවීමේ දී   වශයෙන් පරිණාමයට පත් බව හඳුනාගත හැකි ය.

## 6. නිගමනය

භාෂාවක අක්ෂර නිර්මාණය වන්නේ ස්වාධීනතා, සෙසු භාෂා මෙන් ම ලේඛකයාගේ ලේඛන හැකියාව හා ලිවීමේ උපකරණ හේතුවෙනි. පොදුවේ ගත් කල අක්ෂර ප්‍රභවය හා විකාසය වන්නේ සමාජ අවශ්‍යතාව මතය. එකී සියලු අවශ්‍යතා වනාහී නිර්මාණශීලී භාෂාවක උත්පත්තියයි. සිංහල භාෂාවේ හල් සලකුණ ද භාෂාත්මක ස්වාධීනතාව මතු කරන තවත් එක් සාධකයකි. මාතෘ භාෂා අනුව සැකසී සමාජ ප්‍රවණතා හා අවශ්‍යතා මත පදනම් ව ආවේණික ලක්ෂණ ප්‍රකට කරන මෙම හල් සලකුණ සෙසු භාෂාවලින් සිංහල භාෂාව වෙසෙසා දක්වන්නකි. හල් ලකුණ විකාසනය වීම පිළිබඳ දීර්ඝ ඉතිහාසය විමර්ශනය මගින් පෙනී යන්නේ නූතනයේ අප විසින් භාවිත කරනු ලබන හල් ලකුණේ ස්වරූපද්වය ඒ ඒ අක්ෂර විකාසනයේ ස්වාධීනතාව ප්‍රකට කරන බැවින් ලේඛනය නිවැරදි වන්නේ එවන් විකාසන අවස්ථා අනුව නූතන හල් ලකුණ සකසා ගැනීමෙනි. ඒ අනුව **බ, ඞ, ච, ඣ, ට, ඪ, ඬ, ධ, බ, ම, ඹ, ව** අක්ෂර සඳහා රැහැන් සලකුණ යෙදීමත් සෙසු සෑම ව්‍යඤ්ජනයක් සඳහා ම කොඩි සලකුණත් යෙදීමත් අප අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රමයි. එහි දී ඒ සහ ඕ ස්වර ව්‍යඤ්ජනාරූඪ වීමේදී හල් පිල්ල හෙවත් දීර්ඝත්ව සලකුණ සඳහා පිලි යන නාමය යෙදිය හැකි වුවත් ශුද්ධ ව්‍යඤ්ජන දැක්වීමේ දී යෙදෙන හල් සලකුණ පිල්ලමක් නොවන බවත් පැහැදිලි වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ද්විතියික මූලාශ්‍රය


අමරවංශ හිමි, කොත්මලේ. (2014). *ලක්දිව සෙල්ලිපි.* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ.

හැලෝගම, විමලසේන. (2003). *ශ්‍රී ලාංකික අක්ෂර මාලාවෙහි ආරම්භය.* ආරිය ප්‍රකාශකයෝ වරකාපොළ.

දිසානායක, ජේ.බී. (2006). *සිංහල අක්ෂර විචාරය.* සුමිත ප්‍රකාශකයෝ කළුබෝවිල.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ. (2005) *සිංහල අක්ෂර රූප විකාශය හා භාරතීය ආභාසය.* කර්තෘ ප්‍රකාශන නුගේගොඩ.

පරණවිතාන, ඇස්. සහ පීටර් සිල්වා. ඇම්. එච්. (2009). *සීගිරි ගී වියරණ 1වැනි කාණ්ඩය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කොළඹ.

ප්‍රනාන්දු, පී.ඊ.ඊ.(පරි.) (2008). තිස්ස කාරියවසම්. *සිංහල අක්ෂර මාලාවේ සම්භවය හා විකාසය.* ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය බත්තරමුල්ල.

බෙල්, එච්. සී. පී. (පරි.) (2005) කොත්මලේ කේ. බී. ඒ. එඩ්මන්. *කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොලඹ.

සිල්වා, දොන් මර්තීනු. (පරි.) (2000). කරුණාරත්න සද්ධාමංගල*. ශිලා ලේඛන සංග්‍රහය I.* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ.

දිසානායක, ජේ.බී. (1995). *සමකාලීන සිංහල ව්‍යාකරණය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ.


## References


Inscriptions of Ceylon Vol I. (1970). paranavitana.s. Published by the Department of Archaeology Ceylon.

Inscriptions of Ceylon volumeVII. (Ed.) (2014). Ranawella.SirimalPublished by the department of archaeology Sri Lanka.

Inscriptions of Ceylon. vol V. (Ed.) (2001). Ranawella. G. S. part 1 Published by Department of Archaeology. Sri Lanka.

Inscriptions of Ceylon. vol V. (Ed.) (2004). Ranawella. G. S. part II Published by Department of Archaeology. Sri Lanka.

Inscriptions of Ceylon part VIII. (Ed.) (2007). Ranawella. G. S. Published by Department of Archaeology. Sri Lanka.

Epigraphia Indica vol I- XXXVI (Ed.) (1892). Burgess.Jas. Printed and Bublished by the Superintendent of government printing India.

Epigraphia Zeylanica vol IV. (1934). Codrington. H.W. and Paranavithana.S. (Ed.) Government of Ceylon, Oxford University press.

Epigraphia Zeylanica vol II. (1928). Wikramasinghe. Don mMarthino De Silva. (Ed.) Government of Ceylon Oxford University press.

Epigraphia Zeylanica vol I. (1912). Wikramasinghe. Don mMarthino De Silva. (Ed.) Government of Ceylon. Oxford University.

Epigraphia Zeylanica vol V. (1965). Paranavitana. S. godakumbura. C.E. Archaeological Department Ceylon.


JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

Epigraphia Zeylanica,vol III. (1933). Paranavitana,S, London Oxford University Press.

Epigraphia Zeylanica vol VII. (1984). Karunarathne .Saddamangala. Published by Department of Archaeology. Sri Lanka'

Epigraphia Zeylanica vol II. (Ed.) (1929). Wickremasinghe. Martino De Silva. published for the government of Ceylon by Humphrey milfo oxford university press.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

# 2020 රාජ්‍ය සාහිත්‍ය සම්මාන අවසන් වටයේ කෙටිකතා පිළිබඳ විමර්ශනයක්

# Short stories of the National Literary Awards Festival 2020: A review

*එච්.ඩබ්ලිව්.බී. සම්පත්*

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28


## Abstract

This article is a review on the short story books nominated for the final round of the National Literary Awards Festival (2020) which is the main literary award competition of Sri Lanka. This is based on primary and secondary data. Short story books which were selected for the final round and the other relevant short story books stand as the primary data. Discussions of many critics on this context stand as the secondary sources. The research problem is the investigation of the suitability of these selected books. Kankotage Premaya (Amiththa Weerasinghe), Kedapath Dahasak (Jayathilaka Kammmellaweera), Dan pandurata a Reheyiya (Amali Anupama Mallawa Arachchi), Marene Drive (Anurasiri Hettige), Wishramika Pemwathiya (Erik Ilayaparachchi) Sithuwamen Nerapu Kindurek (Sumudu Niragee Senevirathne) and Sihina Kumara (Mahinda Rathnayeka) are the short story books selected for the final round. Wishramika Pemwathiya is the greatest short story collection published in 2020.


***Keywords***: National literary awards festival, Final round, Wishramika Pemwathiya

**සාරාංශය**

2020 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මානෝත්සවයේ අවසන් වටය නියෝජනය කිරීම සඳහා තෝරා ගැනුණු කෙටිකතා පොත් පිළිබඳ ව විමර්ශනයක් සිදු කිරීම මෙම ලිපියේ අරමුණයි. ශ්‍රී ලංකාවේ වාර්ෂික ව පැවැත්වෙන සම්මානෝත්සව අතුරින් රාජ්‍ය සාහිත්‍ය සම්මානෝත්සවය විශේෂ වනුයේ එය රජයේ මැදිහත් වීමෙන් සිදු කෙරෙන නිල කටයුත්තක් වන බැවිනි. රාජ්‍ය සාහිත්‍ය සම්මානෝත්සවයේ අවසන් වටය සඳහා නිර්දිෂ්ට කෙටිකතාවලින් උසස් කෙටිකතා ලක්ෂණ දක්නට ලැබේ ද? එම කෘති සම්මාන පිදීමකට කෙතරම් සුදුසු වේ ද? යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයයන් ඇසුරු කොට ගනිමින් සිදු කෙරෙන පර්යේෂණයකි. 2020 රාජ්‍ය සාහිත්‍ය සම්මාන අවසන් වටය සඳහා නිර්දිෂ්ට කෙටිකතා පොත් ඇතුළුව මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනෙන කෙටිකතා පොත් ද රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවයට අදාළ සමීක්ෂණ පත්‍රිකා, සමරු කලාප ආදිය ද මෙහි ප්‍රාථමික මූලාශ්‍රය වේ. ප්‍රස්තුත පොත් හා සම්මානෝත්සව පිළිබඳ විචාරක මත ඇතුළත් පළ කිරීම් ද්විතීයික මූලාශ්‍රය වේ. මෙහි දී සිදුවන්නේ ප්‍රස්තුත කෙටිකතා තුලනාත්මක ව විමසමින් ඒවායේ සාධනීය හා නිෂේධනීය ලක්ෂණ විමසා බැලීමයි. රාජ්‍ය සාහිත්‍ය සම්මානෝත්සවය ඇතුළු ව ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාතික මට්ටමේ සාහිත්‍ය සම්මානෝත්සව ගණනාවක තීරකවරයකු වශයෙන් කටයුතු කිරීමෙන් පර්යේෂකයා ලද අත්දැකීම් ද මේ ලිපිය සඳහා පාදක කොට ගැනෙන නමුදු මෙම විමර්ශනය හුදෙක් ස්වාධීන අදහස් හුවා දක්වන්නකි. 2020 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන අවසන් වටය සඳහා කෙටිකතා පොත් හතක් නිර්දේශ වුව ද ඒවා අතුරින් බහුතරයක උසස් කෙටිකතා ලක්ෂණ විද්‍යමාන නොවන බවත් මැරීන් ඩ්‍රයිව් (අනුරසිරි හෙට්ටිගේ), විශ්‍රාමික පෙම්වතිය (එරික් ඉලයප්ආරච්චි) යන පොත් දෙකෙහි කිසියම් තරමක සාර්ථකත්වයක් විද්‍යමාන වන බවත් මෙහි අවසානයේ නිගමනය කෙරෙයි.

***ප්‍රමුඛ පද*** : 2020 රාජ්‍ය සාහිත්‍ය සම්මානෝත්සවය, අවසන් වටය සඳහා නිර්දිෂ්ට කෙටිකතා, උසස් කෙටිකතා ලක්ෂණ, මැරීන් ඩ්‍රයිව්, විශ්‍රාමික පෙම්වතිය

JOURNAL OF THE FACULTY OF HUMANITIES

## 1. ප්‍රවේශය

සිංහල භාෂාවෙන් ඉදිරිපත් කෙරෙන සෙසු සාහිත්‍යාංග සමඟ සැසඳීමේ දී අද්‍යතන සිංහල කෙටිකතාව තරමකින් වත් උසස් මට්ටමක පවත්නා බව කීම අතිශයෝක්තියක් නොවේ. පාඨක ලෝකයා මතු නො ව නිර්මාණකරුවන් හා විචාරකයන් ද ඇතැම් විට සාහිත්‍ය කෘතියක උසස් පහත් බව තීරණය කරන්නා වූ නිර්ණායක වනුයේ එම කෘතියෙන් පිටපත් කීයක් අලෙවි වී තිබේ ද, කී වරක් මුද්‍රණය වී තිබේ ද, සම්මාන උත්සව කීයක අවසන් වටයේ නියෝජනය වී තිබේ ද, සම්මාන කීයක් ලබා තිබේ ද, පිළිගත් විචාරකයන් හා උගතුන් කී දෙනෙකු විචාර පළ කර තිබේ ද වැනි කරුණු ය. ඒවා ඒ ආකාරයෙන් ම පිළිගැනීම සහේතුක නොවෙතත් කවර සීමා යටතේ වුවත් පොතක් සැලකිය යුතු පාඨක හා විචාරක පිරිසකගේ අවධානයට ලක්වීම මෙන් ම සම්මානෝත්සව සංවිධායකයන්ගේ නිර්ණායකත් සම්මාන විනිසුරුවන්ගේ රුචිකත්ව, භාවාකල්පාදියත් පදනම් කොට ගැනුණු ඇගයුම්ශීලී කාර්යයකින් වුවත් උසස් යැ'යි කිසියම් අගය කිරීමකට පත් වීමත් සාපේක්ෂ ව ගත් කල වැදගත් ය. වාර්ෂික ව පැවැත්වෙන පොත් ප්‍රදර්ශනයත්, සම්මානෝත්සව කිහිපයත් නොවන්නට දැනට පළ වන පොත් සංඛ්‍යාව කිහිප ගුණයකින් ම අඩු විය හැකි බව කිව යුතු නො වේ.

වාර්ෂික ව සිංහල කෙටිකතා උදෙසා සම්මාන ප්‍රදානය කෙරෙන උත්සව කිහිපයක් ම දැනට පැවැත්වේ. රාජ්‍ය සාහිත්‍ය සම්මාන, විදෙ‍ාදය සාහිත්‍ය සම්මාන, ගොඩගේ සාහිත්‍ය සම්මාන, රජත පුස්තක සම්මාන ආදි වශයෙන් ඒවා පෙළගැස්විය හැකි වේ. මෙවැනි සම්මානයකට නිර්දේශ වීමෙන් පොතකට පිළිගැනීමක් ලැබෙන බව ප්‍රමුඛ පෙළේ නිර්මාණකරුවන්ගේ සහ විචාරකයන්ගේ ද පිළිගැනීම ය. සම්මානයකට නිර්දේශ වීමෙන් පොතකට පිළිගැනීමක් ලැබෙන බව සමන් වික්‍රමාරච්චි ද වරක් ප්‍රකාශ කර තිබේ.[25] කිසි යම් වසරක දී පැවැත්වෙන සියලු ම සම්මානෝත්සව අතරින් රාජ්‍ය සාහිත්‍ය සම්මානය වැදගත් වනුයේ එය රජයේ මූලිකත්වයෙන් සිදු කෙරෙන ජාතික කාර්යයක් වන බැවිනි. කලින් කලට විවේචන, චෝදනා, අතපෙවීම් ආදියට මුහුණ දීමට සිදු වූ නමුදු අදටත් එය වාර්ෂික ව රටෙහි පැවැත්වෙන ප්‍රධානතම සාහිත්‍ය කෘති අගය කිරීමේ කාර්යයි, බහුතර පිරිසකගේ අවධානය යොමු වන සම්මාන පිදීමයි. මෙම ලිපිය මගින් විමසා බැලෙනුයේ 2020 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලෙහි අවසන් වටය නියෝජනය කළ කෙටිකතා සංග්‍රහ පිළිබඳවයි. ඒවායේ සාධනීය-නිෂේධනීය ලක්ෂණ, නව්‍ය දෘෂ්ටි වාද, අලුත් ආකෘති හා ප්‍රවණතා පිළිබඳව ද මෙහිදී විමසා බැලේ.

රටෙහි වසංගත තත්ත්වයක්, දරුණු ස්වාභාවික උපද්‍රවයක්, ත්‍රස්ත ප්‍රහාරයක් වැනි ජාතික ව්‍යසනයක් නොවන්නට සාමාන්‍යයෙන් වසරකට කෙටිකතා පොත් පනහකට ආසන්න සංඛ්‍යාවක් වත් පළ වෙයි. 2019 වසරේ සියයකට ආසන්න කෙටිකතා පොත් ගණනක් පළ ව තිබීම යම් සාධනීය තත්ත්වයකි. සාමාන්‍යයෙන් රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවයේ දී සම්මාන පිදීම සිදු කෙරෙන්නේ පෙර වසරේ ජනවාරි පළමු වන දා සිට දෙසැම්බර් 31 වන දා තෙක් පළ වූ කෘති

[25] වික්‍රමාරච්චි, සමන්, 'සම්මානයකට නිර්දේශ වීමෙන් පොතකට පිළිගැනීමක් ලැබෙනවා', සිළුමිණ, 2018 සැප්තැම්බර් 01, ('ස්වර්ණ පුස්තක අවසන් වටයට නිර්දේශ වූවෝ මෙසේ පවසති' - පුන්කලස අතිරේකය)

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

වෙනුවෙනි.[26] ඒ අනුව 2019 වසරේ කෘති සඳහා 2020 වසරේ දී සම්මාන පිදීම සිදු කළ යුතුව පැවතුණත් වසරකටත් වැඩි කලක් තිස්සේ රටෙහි පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම කටයුත්ත 2021 වසර දක්වාත් දිග්ගැස්සී තිබේ.

සියයකට ආසන්න කෙටිකතා පොත් අතුරින් 2020 වසරේ දී විශිෂ්ටතම කෙටිකතා කෘතිය සඳහා පිදෙන සම්මානය සඳහා නිර්දේශ වී ඇත්තේ පොත් හතකි. රාජ්‍ය සාහිත්‍ය සම්මානය උදෙසා පොත් සපයා ගැනීම ලේඛකයන් හා ප්‍රකාශකයන් වෙතිනුත් පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ලියාපදිංචි තොරතුරු විමසීමෙනුත් සිදු කෙරේ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන්, ඒ ඒ කාලවල රටේ පවත්නා දේශපාලන වෙනස්කම් අනුව කලා මණ්ඩලය යටතේ රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලය හෝ උපදේශන මණ්ඩලයක් මඟින් රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවය සිදු කෙරෙන අතර මූලික වශයෙන් පොත් තේරීම එවැනි අනුමණ්ඩලයකින් ද අවසන් වටවල පොත් තේරීම එයින් පරිබාහිර පිරිසක් වෙතින් ද සිදු කෙරේ. අනුමණ්ඩල හා බාහිර සමීක්ෂක මණ්ඩල සඳහා තෝරා ගැනෙන සාමාජිකයෝ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ඒ ඒ ක්ෂේත්‍රවලට සම්බන්ධ වෙනත් වෘත්තිකයන්, සුප්‍රකට ලේඛකයන්, තනතුරුවලින් විශ්‍රාම ගෙන සිටින විද්වතුන් ආදීන්ගෙන් සමන්විත වෙති. අවසන් වටයේ පොත් අතුරින් සම්මානය පිරිනැමිය යුතු කෘතිය තෝරා ගැනෙන්නේ ඒ ඒ සමීක්ෂකවරුන් ලබා දෙන ලකුණු සංඛ්‍යාවේ එකතුව සැලකීමෙනි. 2020 වසරේ දී ලකුණු ලබා දීමේ දී සැලකිල්ලට ගැනුණු අංශ තුනකි.

1. අන්තර්ගතය, අපූර්වත්වය හා නිර්ව්‍යාජත්වය

2. වස්තු වින්‍යාසය, කෙටිකතා මාධ්‍යයට අදාළ ස්වලක්ෂණ පිළිබඳ අවබෝධය

3. රචනා ශෛලිය, නිරවද්‍ය හා නිර්මාණාත්මක භාෂා භාවිතය හා ස්වීයත්වය[27]

අනුමණ්ඩලයේ හෝ උපදේශක මණ්ඩලයේ සාමාජිකයන්ගේ කෘති සම්මාන පිරිනැමීමේ කාර්යයෙන් බැහැර කෙරෙන අතර ම අවසන් වටයේ පොත් අතුරින් සම්මාන පිරිනැමෙන කෘති තේරීම සිදු කරන්නේ ද අනුමණ්ඩලයේ හෝ උපදේශන මණ්ඩලයේ සාමාජිකයන් නොවන, බැහැරින් පත් කළ සමීක්ෂකවරුන් පිරිසකි. එවැනි සම්ප්‍රදායයක් අනුගමනය කෙරෙනුයේ ස්වාධීන හා සාධාරණ තීරණයක් ලබා ගැනීම උදෙසා ය.

සාහිත්‍ය නිර්මාණ සමීක්ෂණය වූ කලී ඇගයුම්ශීලී කාර්යයකි. ඒ අනුව ඒ ඒ පුද්ගලයාගේ රුචිකත්ව, භාවාකල්ප, පූර්ව ප්‍රතිරූප මවා ගැනීම් ආදියෙන් සපුරා නිදහස් විය හැකි නොවේ. කෙතරම් ස්වාධීන හා සාධාරණ තීන්දුවක් ලබා ගැනීමට අපේක්ෂා කරන අවස්ථාවක දී වුව ද වෙනස් තීන්දු ලැබිය හැකි වන්නේ ඒ නිසා ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

---

[26] රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සව සමරු කලාපය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2014 (https://noolaham.net/project/816/81558/81558.pdf)

[27] රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානය - 2020, ග්‍රන්ථ සමීක්ෂණය - අවසන් වටය, සමීක්ෂණ පත්‍රිකාව

ඇතැම් විට සමීක්ෂකවරුන් තුළ ඒ ඒ නිර්මාණකරුවන් පිළිබඳ ව මහා ප්‍රතිරූප ගොඩනැඟී ඇති බව පෙනේ. තමන්ගේ ගුරුවරුන්, විශ්වවිද්‍යාල ආචාර්ය-මහාචාර්යවරුන්, බොහෝ කාලයක් නිර්මාණ කාර්යයේ නිරතව සිටි ලේඛකයන්, මහා විචාරකයන්ගේ ප්‍රශංසා ලද ලේඛකයන්, පෙර වසරවල සම්මාන ලැබූවන් විසින් රචනා කරන ලද පොත-පත පිළිබඳ ව ඇතැම් සමීක්ෂකවරුන්ට විශේෂ ගෞරවයක් ඇත. කිසියම් ලේඛකයකුගේ කෘතියක් ඒ වන විට පවත්වා ඇති වෙනත් සාහිත්‍ය උත්සවවල දී ද අදාළ ඉසව්වෙන් ම සම්මානය ලබා ඇත් නම් එය ද එම කෘතියට විශේෂ පිළිගැනීමක් ඇති වීමට හේතු කාරණා විය හැකි ය. එසේ ම සම්මාන විනිශ්චය සඳහා සම්බන්ධ කොට ගැනෙන්නා වූ ඇතැම් අය නාමමාත්‍රික ව ඒ ඒ ක්ෂේත්‍ර නියෝජනය කරන විශ්වවිද්‍යාල ප්‍රජාව හෝ පැරණි සාහිත්‍යකරුවන් වුව ද ඔවුන් මේ වන විට සක්‍රීය ව ඒ ඒ ක්ෂේත්‍රවල ජීවත් නොවීම ද සාධාරණ විනිශ්චයක් ලබාගැනීමට බාධාකාරී වන අවස්ථා ඇත.

ඒ ඒ සමීක්ෂකවරුන්ගේ ලකුණු අතර පරතර පැවතීම ද ඇතැම් විට සාධාරණ තීන්දුවක් ලබා ගැනීමට බාධා සිදු කරන අවස්ථා ඇත. නිදර්ශනයක් වශයෙන් සමීක්ෂකවරුන්ගෙන් බහුතර පිරිසක් අවසන් වටයේ පොත් කිහිපය සඳහා ලබා දෙන අඩුම සහ වැඩිම ලකුණු ප්‍රමාණය 60-70 වැනි මධ්‍යස්ත අගයක් ගත්ත ද කිහිප දෙනෙකුගේ ලකුණු ප්‍රමාණ 20-100 වැනි අගයක් ගනී නම් එය සාධාරණ තීන්දුවක් ඇති වීමට බාධාවකි. එවැනි තත්ත්ව නිසා ම දුර්වල කෘතිවලට සම්මාන පිරිනැමුණු අවස්ථා පෙර වසරවල දක්නට ලැබේ. එවැනි දුර්වලතා මගහැරීම සඳහා සමීක්ෂකවරුන් කැඳවා අවසන් සාකච්ඡාවටයක් ද සිදු කෙරෙන නමුත් ඒවායෙන් ද නොවිසඳුණු තත්ත්ව පැවැති අවස්ථා තිබිණ.

## 2. මූලාශ්‍රය

2020 වසරේ දී රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවයේ අවසන් වටය නියෝජනය කළ කෙටිකතා සංග්‍රහ සත පහත පරිද්දෙනි. ඒවා ඉදිරිපත් කොට ඇත්තේ අකාරාදි පිළිවෙළිනි.

1. **කන්කොටාගේ ප්‍රේමය සහ තවත් කතා** - අමිත්ත වීරසිංහ[28]
2. **කැඩපත් දහයක්** - ජයතිලක කම්මැල්ලවීර[29]
3. **දං පඳුරට ආ රූහැයියා** - අමාලි අනුපමා මල්ලවආරච්චි[30]
4. **මැරීන් ඩ්‍රයිව්** - අනුරසිරි හෙට්ටිගේ[31]
5. **විශ්‍රාමික පෙම්වතිය** - එරික් ඉලයප්පාරච්චි[32]
6. **සිතුවමෙන් නෙරපූ කිඳුරෙක්** - සුමුදු නිරාගී සෙනෙවිරත්න[33]

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

[28] වීරසිංහ, අමිත්ත, 'කන්කොටාගේ ප්‍රේමය සහ තවත් කතා', Ni-Cey International (pvt) Ltd" රාජගිරිය, 2019
[29] කම්මැල්ලවීර, ජයතිලක, 'කැඩපත් දහයක්', විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ, 2019
[30] මල්ලවආරච්චි, අමාලි අනුපමා, 'දං පඳුරට ආ රූහැයියා', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 2019
[31] හෙට්ටිගේ, අනුරසිරි, 'මැරීන් ඩ්‍රයිව්', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 2019
[32] ඉලයප්පාරච්චි, එරික්, 'විශ්‍රාමික පෙම්වතිය', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 2019
[33] සෙනෙවිරත්න, සුමුදු නිරාගී, 'සිතුවමෙන් නෙරපූ කිඳුරෙක්', විදර්ශන ප්‍රකාශකයෝ, දෙහිවල, 2019

7. සිහින කුමරා - මහින්ද රත්නායක[34]

මේ ලේඛකයන් අතුරින් කිහිප දෙනෙක් ම පෙර වසරවල දී ද කෙටිකතා අංශයෙන් රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි කර ගත් අය වෙති. ජයතිලක කම්මැල්ලවීර 1985, 1992, 1994, 2003 යන වසරවල (පිළිවෙළින් කළුසපත්තු, මාංචු, අන්තිම කැමැත්ත, 5 වැනි ජවනිකාව යන කෙටිකතා සංග්‍රහ උදෙසා) ද අනුරසිරි හෙට්ටිගේ 2012, 2016 (සිංහබාහු එනකං, දිමියා) යන වසරවල ද, සුමුදු නිරාගී සෙනෙවිරත්න 2017 (ගිහින් එන්න කානිවල්) වසරේ ද රාජ්‍ය සාහිත්‍ය සම්මානය ලබා ඇත.

2019 වසර වෙනුවෙන් පවත්වා ඇති වෙනත් සම්මාන උත්සවවල දී සම්මාන දිනා ඇති කෙටිකතා සංග්‍රහයන් වන්නේ එරික් ඉලයප්ආරච්චිගේ 'විශ්‍රාමික පෙම්වතිය' හා අනුරසිරි හෙට්ටිගේගේ 'මැරීන් ඩ්‍රයිව්' යන කෘති දෙකයි. විශ්‍රාමික පෙම්වතිය විදෙ‍්‍යාදය සම්මානය සහ විශිෂ්ටතම කෙටිකතා සංග්‍රහය වෙනුවෙන් පිරිනැමෙන ගොඩගේ සාහිත්‍ය සම්මානය දිනා ඇත. මැරීන් ඩ්‍රයිව් කෘතිය රජත පුස්තක සම්මානය දිනා ඇත. ගොඩගේ සාහිත්‍ය සම්මානයෙන් මැරීන් ඩ්‍රයිව් ස්වෙච්ඡාවෙන් ඉවත් කොට ගෙන ඇත්තේ එහි ලේඛකයා එම සම්මානොත්සවයේ කටයුතුවලට සම්බන්ධ ව කටයුතු කර ඇති නිසාවෙනි. එය සාමාන්‍යයෙන් සම්මානෝත්සවවලවල දී අනුගමනය කෙරෙන සම්ප්‍රදායයකි.

## 3. විමර්ශනය

2020 රාජ්‍ය සාහිත්‍ය සම්මානෝත්සවයේ අවසන් වටයේ කෙටිකතා සඳහා තේරී ඇති කන්කොටාගේ ප්‍රේමය සහ තවත් කතා නම් කෘතිය එවැනි නිර්දේශයකට තරම් වැදගත්කමක් ප්‍රකට නොකරන්නා වූ කෙටිකතා එකතුවකි. එහි ලේඛක අමිත්ත වීරසිංහ නළුවකු වශයෙන් ප්‍රකට ව සිටින්නකු වුව ද කෙටිකතා ක්ෂේත්‍රය තුළ එතරම් ප්‍රතිභාවක් පළ කර ඇති බවක් නොපෙනේ. පොතෙහි පළමු වන වැකියේ සිට ම[35] භාෂා දෝෂ සුලභ ව විද්‍යමාන වේ. භාවාතිශය අවස්ථා (තැඹිලි ගස කපා ඉවත් කර දමන ලදී) මෙන් ම ප්‍රචාරකවාදී ලක්ෂණ ද එහි ඇතුළත් කෙටිකතාවල බහුල ව පෙනේ. අර්ජුන්[36] වැනි ඇතැම් කතාවල කාල පරස්පරතා පවතී. කතුවරයා සෑම කතාවකින් ම පාහේ මානව දයාව පිළිබඳ ව සාකච්ඡා කොට තිබීම සාධනීය ලක්ෂණයකි. නූතන තාක්ෂණික ලෝකයේ අත්දැකීම් ප්‍රකාශ කළ හැකි නව්‍ය ආකෘති භාවිත කිරීම පිළිබඳ ව ද කතාකරුවා (Feeling Awesome with) තිරිතදිග මෝසම් වැනි කතාවල දී) අත්හදා බැලීම් සිදු කර ඇත. කතාව ආරම්භයේ දී කිසියම් පූර්ව කථනයක් යොදා ගෙන තිබීම ද කතුවරයාගේ ආකෘතියෙහි අංගයක් වුව ද එයින් කතා රසයට හානි සිදු වූ බවක් නිරීක්ෂණය කළ හැකි වේ. කෙටිකතාවට දෘශ්‍ය ගෝචර අගයක් එක් කිරීමට උත්සුක වීම ද කතාකරුවාගේ වැදගත් අදහසකි. එසේ වුව ද සමස්තයක් වශයෙන් ගත් කල මෙහි ඇතුළත් කතාවලින් බහුතරයක් මතුපිටින් කියන කතා ය, ඒවායෙන් මානව ජීවිතයේ හෝ සමාජයේ ඇතුළාන්තය විවරණය වන්නේ සීමා සහිත වශයෙනි.

[34] රත්නායක, මහින්ද, 'සිහින කුමරා', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 2019
[35] 'කන්කොටාගේ ප්‍රේමය සහ තවත් කතා', පි. 07
[36] එම, පි. 94

ජයතිලක කම්මැල්ලවීර සම්මාන දිනූ, සුප්‍රකට කෙටිකතාකරුවකු වුව ද ඔහුගේ මෑත කාලීන කෙටිකතා සංග්‍රහවල මුල් යුගයේ කෙටිකතාවල වැනි සාර්ථකත්වයක් දක්නට ලැබෙන්නේ නැත. එම කෘතිවල ඇති කෙටිකතාවලින් එකක් දෙකක් යම් සාර්ථකත්වයක් ප්‍රකට කරන නමුදු පොදුවේ කෙටිකතා පොතෙහි යම් නව්‍යත්වයක්, අපූර්වත්වයක් දක්නට ලැබෙන්නේ නැත. කැඩපත් දහයක් කෙටිකතා පොතෙහි එන කතා දහය පිළිබඳ ව ද ඊට වැඩි විචාරයක් කිරීමට නැත.

මහින්ද රත්නායක ලියූ සිහින කුමරා නම් කෙටිකතා එකතුව ද විශේෂ වැදගත්කමක් නොපෙන්වන කෘතියකි. නව්‍යවාදී ලක්ෂණ ආයාසයෙන් එක් කර ගැනීමේ ශිල්ප හරඹයක් විනා ඒවායෙන් අව්‍යාජ කතා රසයක් වහනය වන්නේ නැත. ශක්‍රයා නම් කෙටිකතාවේ දී කතාවේ ආරම්භක පිටු පහ ම කපා හළ බවක් පෙන්වීමට හරහට ඉරි ගසා ඇත. කතුවරයා ඉන් අරමුණු කොට ගෙන ඇත්තේ අද කාලයේ එදවස මෙන් ශක්‍රයා අසරණයන් උදෙසා පිහිටට නොපැමිණෙන බව කියා පෑම ය. මේවා ඉතා ප්‍රාථමික වූත් හාස්‍යෝත්පාදක වූත් කතා උපක්‍රම ය. එවැනි ලක්ෂණ යොදා ගැනීම නිසා කතුවරයා තෝරා ගෙන ඇති ඇතැම් දුර්ලභ අත්දැකීම්වලට ද හානි සිදු ව තිබේ. 'මමත් පිරිමි බවත් ලදිමි' නම් කතාවේ ලිංග විපර්යාසය ද ව්‍යාජ භාෂා උපක්‍රමයකි. කතුවරයා යොදා ගෙන ඇති, 'ඔහු ගත්තාය'[37], 'ඇය සිටියේ ය'[38] වැනි ව්‍යවහාරවලින් අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීමට හැකි වී ඇති බවක් නොපෙනේ. එහෙත් තමා අනුගමනය කරන සියල්ලක් ම නිවැරදි යැ'යි කතුවරයා විශ්වාස කරන බවක් පෙනේ. ඔහු තම භාෂා භාවිතය පිළිබඳ ව කියා ඇත්තේ මෙබන්දකි,

> ''පුරුදු පරිදි මගේ මෙම නිර්මාණ එකතුවේ ද සිටිනවුන් කතා කරනුයේ, සිතනුයේ මහප්‍රාණ, මූර්ධජ අක්ෂරවලින් නොවේ. ඔවුන් උසුරුවනුයේ ස්වාභාවික ශබ්දය. ඔවුන්ගේ දෙබස්හි සිද්ධ වන 'ලේඛනයේ පිළිගත් අක්ෂර වින්‍යාසය උල්ලංඝනය' ඒ නිසා සිද්ධ වන්නක් මිස නොදැන, වැරදීමෙන් යෙදූවක් නොවේ.''[39]

පොතෙහි කංචුක වැකිය (පසු වදන) තමා ම නම, තනතුර ආදිය ද සහිත ව ලියා දක්වන ලේඛකයා එහි දී කියා ඇත්තේ කෙටිකතාව හරිහැටි කියවා ගැනීමට සිංහල පාඨකයා මෙන් ම විචාරකයා ද අසමත් ව ඇති බවයි. ඔවුන්ගේ කියැවීම ඉතාමත් ම දුප්පත් බවයි.

> ''විශේෂයෙන් ම නිර්මාණයකට තීරණ දිය හැකි සුදුස්සෝ පසෙක තබා නුසුදුස්සෝ ම එම කාර්යයේ යෙදීම හා යෙදවීම නිසා සිංහල විචාරය මෙන් ම එහෙයින් ම සාහිත්‍යය ද ඇත්තේ සුවිශාල බේදවාචකයක ය. මගේ මේ නිර්මාණ කියැවීම හා ඇගැයීම එවැන්නන් අතට පත් නොවී ඊට නිස්සෝ (සුදුස්සෝ) අතට පත් වේවා!'යි යනු මාගේ ප්‍රාර්ථනයයි.''[40]

---

[37] 'සිහින කුමරා', පි. 78

[38] එම, පි. 79

[39] එම, පි. 06

[40] එම, පිටකවරය

මෙහි අවසන් වැකියේ දක්වා ඇති පරිදි නිස්සෝ, සුදුස්සෝ, නුසුදුස්සෝ වැනි පද අනුක්ත රූපයේ යෙදිය හැකි නොවේ. 'කොලු රංචුව වටේ කැරකෙයි'[41] වැනි තවත් ව්‍යාකරණ වැරදි ද 'ධෛර්යමත් ව'[42] වැනි පදසාධන දෝෂ ද පොතෙහි දක්නට ලැබේ. ඒවා පූර්වයේ දැක්වූ භාෂා ප්‍රතිපත්තියට අනුව සාධාරණීකරණය කළ නොහේ. 'කථිකාචාර්යවරයා' පරයා 'අසික්කිතයා' මතුවන ආකාරය[43] ද ඇතැම් විට දක්නට ලැබේ.

කෙසේ නමුදු කතාකරුවා ම කංචුක වැකිය මඟින් කියා ගන්නා පරිදි මෙම කෙටිකතාවලට ඇගයීමක් නොලැබේ නම් එය කතාවල වරදක් නො ව, පාඨකයන්ගේ හා විචාරකයන්ගේ දෝෂයකි. කතාකරුවා ම තම නිර්මාණ පිළිබඳ ව එබඳු අධිතක්සේරුවක් ඇති කර ගත්ත ද මෙම කෙටිකතාවල සාහිත්‍ය සම්මානෝත්සවයක් සඳහා අවසන් වටය නියෝජනය කිරීමට තරමේ වත් වැදගත්කමක් ඇති බවක් නම් නොපෙනේ. සාමාන්‍ය කතා රසය ඉක්මවන්නා වූ කෙටිකතා අගයක් මේවායෙහි විද්‍යමාන නොවන තරම් ය.

අමාලි අනුපමා මල්ලවආරච්චි මේ වන තුරු කෙටිකතා ක්ෂේත්‍රය තුළ ප්‍රකට ව සිටි ලේඛිකාවක නොවූව ද ඇගේ 'දං පඳුරට ආ රැහායියා' යම් සාර්ථකත්වයක් ප්‍රකට කරන කෘතියකි. එය ගොඩගේ ප්‍රකාශකයන් වාර්ෂික ව පවත්වන අත්පිටපත් තරගයෙහි ජයග්‍රාහී කෘතියයි. තව දුරටත් දියුණු කළ හැකි, දියුණු කළ යුතු නිර්මාණාත්මක ප්‍රතිභාවක් කෙටිකතාකාරිය සතු වන බවට එම කෙටිකතා සාක්ෂ්‍ය සපයයි. බහු ආඛ්‍යාන ශිල්ප ධර්මය, එනම් ආඛ්‍යාන කිහිපයක එකතුවක් වශයෙන් කෙටිකතා ප්‍රබන්ධය කිරීම එහි එන කතා කිහිපයක ම දක්නට ලැබෙන ලක්ෂණයකි. දුර්ලභ වූත්, අනුස්මරණීය වූත් අත්දැකීම් එම කෙටිකතාවලට විෂය කොට ගෙන තිබේ. ඇගේ 'ස්මරණ', 'මෘත' වැනි කෙටිකතා ප්‍රේමය පිළිබඳ වෙනස් විදිහක කියැවීම් ය. 'අරුන්දතී', 'ලොකු අක්කා සහ පඹයා' වැනි කෙටිකතාවලින් ප්‍රකට වන සංකේතීය අර්ථ ප්‍රකාශනය රසිකයා තුළ නවමු රසයක් ඇති කරයි. තැන් තැන්වල විද්‍යමාන වන ආධුනික ලක්ෂණ නොවන්නට දං පඳුරට ආ රැහැයියා අවසන් වටය නියෝජනය කරන කෙටිකතා අතරට එක්වීම සාධාරණීකරණය කිරීමට බාධාවක් නැත.

අවසන් වටය නියෝජනය කරන කෙටිකතා අතරට එක් ව ඇති සුමුදු නිරාගී සෙනෙවිරත්නගේ සිතුවමෙන් නෙරපූ කිඳුරෙක් කෘතිය ද එතරම් විශේෂත්වයක් ප්‍රකට නොකරන්නකි. එහි ඇතුළත් කතා අහිංසක කෙටිකතා ය. ඒවායේ ලිඛිත භාෂා ප්‍රයෝග හරියාකාරව ම අනුගමනය කොට ඇත. සමාජ සංස්කෘතියට හානිකර දේවල් හෝ සමාජය තුළ කැළඹීමක් ඇති කරන දේවල් හෝ කිසිවක් එම කතාවන්හි විද්‍යමාන නොවේ. එහෙත් ඒවා හුදු කියැවීමකට පමණක් සීමා කළ හැකි කතා ය. විශේෂ අගයක් ඒවායෙහි විද්‍යමාන වන්නේ නැත. ඇගේ 'ගිහින් එන්න කානිවල්' කෘතිය සම්මානයට පාත්‍ර වුව ද එම කතාවන්හි පවා විශේෂ වැදගත්කමක් දක්නට ලැබෙන්නේ නැත.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

[41] එම, පි. 91
[42] එම, පි. 40
[43] එම, පි. 87

## 4. නිගමනය

අනුරසිරි හෙට්ටිගේගේ මැරීන් ඩ්‍රයිව් හා එරික් ඉලයප්ආරච්චිගේ විශ්‍රාමික පෙම්වතිය 2019 වසරේ පළ වූ කෙටිකතා සංග්‍රහ අතරින් යම් උසස් මට්ටමක් ප්‍රකට කරන බව කිව හැකි ය. එම පොත් දෙක හැරුණු කල 2020 රාජ්‍ය සාහිත්‍ය සම්මාන අවසන් වටය සඳහා තේරී ඇති බොහෝ පොත්වල සැලකිය යුතු තරමේ විශේෂත්වයක් නොපෙනේ. අවසන් වටයට නොතේරුණු 'ගැහැනු පිරිමි මල් පලතුරු'[44] (ඉසුරු චාමර සෝමවීර), 'අපරාදෙ ඒ නොවැම්බර්'[45] (කපිල එම්. ගමගේ) වැනි ඇතැම් කෙටිකතා පොත්වල විද්‍යමාන වන තරමේ සාර්ථකත්වයක් වත් එකී නිර්දිෂ්ට පොත්වල පවතින බවක් නොපෙනේ.

මැරීන් ඩ්‍රයිව් කෘතියේ එන නිර්මාණ කෙටිකතා රසයෙන් යුතු වෙයි. චෙකෝෆ් වැනි උසස් කෙටිකතාකරුවන්ගේ නිර්මාණවල විද්‍යමාන වන එකී කෙටිකතා රසය පාඨකයා විසින් ම විඳ ගත යුතු වන්නක් විනා වෙනත් ලෙසකින් පැහැදිලි කළ හැක්කක් නොවේ. ජීවිතයට සමීප ව, තාත්තලාගේ කතාව, කහපාට මිනිස්සු, මැරීන් ඩ්‍රයිව්, බැස පලයන් ස්වර්ණමාලි, ඉම්රාන්ගේ භවාන්තර චාරිකාව යන කෙටිකතා හය එම කෘතියට ඇතුළත් වේ. ඒවා අතරින් ජීවිතයට සමීප ව, කහපාට මිනිස්සු, මැරීන් ඩ්‍රයිව්, ඉම්රාන්ගේ භවාන්තර චාරිකාව යන කතා හතර විශේෂ වශයෙන් සාර්ථක ය. කතුවරයා හුදෙක් කතාවක් කියාගෙන යන්නේ නැතිව පාඨකයාගේ සිතුවිලි කලම්බනය කර ඔහු නිහඬ වීම ඒවායේ විද්‍යමාන වන විශේෂත්වයකි. කතාව කියවා අවසන් වූ විට පාඨකයාට සිතෙන්නේ කොහේ දෝ අමුතු ලෝකයක අතරමං වූ වැනි හැඟීමකි. පාඨකයා සතුව ඇති කතාව රසවිඳීමේ නිදහස උදුරා නොගැනීම හා ඔහුගේ රසඥතාව පරිදි කතාව විඳීමට අවස්ථාව ඉතිරි කොට තැබීම වැනි උසස් කෙටිකතා ලක්ෂණ ජීවිතයට සමීප ව, මැරීන් ඩ්‍රයිව්, කහපාට මිනිස්සු වැනි කෙටිකතාවල විශේෂ වශයෙන් විද්‍යමාන වෙයි.

කතාකරුවා ම පවසන පරිදි මේ කතාවල දී වැදගත් වන්නේ එහි යටිපෙළ සමග බැඳුණු කතාවයි. කතාවල ගැටුම පවතින්නේ කියන කතාවට මතුපිටිනි. ඇත්ත ම කතාව පටන් ගන්නේ කතුවරයා නතර කරන තැනිනි.

''කතාන්දර කියන්නෙ ඇත්ත ම නෙවෙයි.... ඇත්ත තියෙන්නෙ කතාන්දරයට එළියෙන්.... මිනිස්සු තමයි ඇත්ත....''

''මිනිස්සු තමයි ලෝකය.... මිනිස්සු තමයි ආගම... මිනිස්සු තමයි හැම දේම....'' (ඉම්රාන්ගේ භවාන්තර චාරිකාව)[46]

කහපාට මිනිස්සු කතාවෙන් සාකච්ඡා වන්නේ අතීතයේ සිට අද තෙක් විවිධ ස්වරූප අනුව ආගමට සම්බන්ධ ව මිථ්‍යාව මුල්බැසගෙන ඇති ආකාරයයි, ආගමික ලේබල්වලට, ශුද්ධත්වයේ සළුවට, කහපාටට මුවා වී යම් යම් පුද්ගලයන් තම තමන්ගේ පැවැත්ම උදෙසා ඇති කරගෙන තිබෙන තත්ත්වය පිළිබඳව යි.

---

[44] සෝමවීර, ඉසුරු චාමර, 'ගැහැනු පිරිමි මල් පලතුරු', Grantha (Pvt) Ltd" කොළඹ, 2019
[45] ගමගේ, කපිල එම්., 'අපරාදෙ ඒ නොවැම්බර්', ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ 2019
[46] 'මැරීන් ඩ්‍රයිව්', පි. 99, 106

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

එය කෙතරම් බේදවාචකයක් වී ද යත් මනුෂ්‍යයාගේ ලිංගිකත්වය පවා තීරණය වන්නේ එම ආගමික අධිකාරයන්ට අවශ්‍ය විදිහටයි. කතාවේ කේන්ද්‍රීය චරිතය වන යසනාත් වෛද්‍යවරයකු වුවත් අවසන් වශයෙන් ඔහුට පවා ඉතිරිව ඇත්තේ මෙකී තිරශ්චීන සත්තාව බාර ගැනීම පමණයි. මෙහි ''කහපාට'' යන්නෙන් මතුවෙන්නේ සංකේතීය අර්ථයකි. මෙම කතාව සම්බන්ධයෙන් විවේචනයක් ඇති වන්නේ නම් එසේ විය හැකි වන්නේ සාම්ප්‍රදායික සමාජය විසින් කාලාන්තරයක් තිස්සේ පිළිගන්නා ලද, පවත්වාගෙන එව ලද, පෝෂණය කරන ලද ඇගයුම් හා පිළිගැනුම් කතාකරුවාගේ උපහාසාත්මක විවේචනයට ලක් වීම ය.

බහුජාතික හා බහු ආගමික සමාජය පිළිබඳ පාඨකයාට විවිධාකාරයෙන් කල්පනා කිරීමට අවස්ථාව සලසා දී ඇති කතා දෙකක් වශයෙන් 'තාත්තලාගේ කතාව' හා 'ඉම්රාන්ගේ භවාන්තර චාරිකාව' හැඳින්වීමට පිළිවන. එකම අවකාශයකදී හමුවන ලවුඩ්ස්පීකර් හඬ කතාකරුවාගේ ශ්‍රැතේන්ද්‍රියට අසුව ඇත්තේ මෙසේ ය,

> ''ල්ලා.... හ්... අල්ලා...හ්... හුවක්බර්.. අල්ලා..හ් -
>
> අප්ප කිච්චෝච සල්ලහුකවුත්ති -
>
> අල්ලා යේකේච පානි අල්ලා...හ්... හුවක් අනවසේසා''[47]

එහෙත් මේ සමාජය තුළ හැදුණු වැඩුණු අහිංසක ඉම්රාන්ට කතාව පුරාවට ම පීඩා විඳීමට සිදුව ඇත්තේ ඔහු නොකළ වරදකට ය. මනුෂ්‍යත්වය ගැන අලුත් විදිහකට කල්පනා කිරීමට කතාකරුවා පාඨකයන් වන අපට ආරාධනා කරයි.

එරික් ඉලයප්ආරච්චිගේ විශ්‍රාමික පෙම්වතිය කෘතියෙහි දක්නට ලැබෙන විශේෂත්වයක් වනුයේ පැරණි අත්දැකීමක් වුව ද ප්‍රබල ප්‍රකාශනයක් සහිත ව, අනුස්මරණීය අත්දැකීම් ලෙස ඉදිරිපත් කිරීමට කතාකරු සමත් ව තිබීමයි. එහි කෙටිකතා 15ක් ඇත. ඒවා අතරින් මුල් කතා කිහිපය (භික්ෂු වාට්ටුව, ඇමේසන් ගින්න, යකඩ බාල්දිය ආදිය) වඩාත් සාර්ථක ව ඇති බව පෙනේ. සමකාලීන සමාජ අත්දැකීම් කලාත්මක ලෙස, සංයමයෙන් හා මානව දයාවෙන් යුතු ව විවරණය කිරීමට කතාකරු සාමර්ථ්‍යයක් ප්‍රකට කරයි. ඇතැම් කතාවක ආකෘතිය හා අන්තර්ගතය යම් සංකීර්ණ භාවයකින් යුක්ත වන බවක් පෙනේ. ඒවා වටහා ගැනීමට, රසවිඳීමට හැකි වනුයේ යම් කියැවීමක් හා හැදෑරීමක් ඇති උගත් පාඨක පිරිසකට පමණක් බව සිතේ. කෙටිකතාව සාමාන්‍ය පාඨකයාගෙන් දුරස් වීම සුදුසු නොවෙතත් පාඨකයා වඩාත් උසස් බුද්ධිමය තලයකට, බුද්ධිමය සංවාදයකට කැඳවීමට කතාකරුවා උත්සුක ව තිබීම අතින් ගත් කල නම් මෙම කෙටිකතා අගය කළ යුතු වේ.

''නාට්‍ය අනුවර්තනය" පර්යේෂණාත්මක ව ප්‍රබන්ධය කරන ලද එබඳු කෙටිකතාවකි. ඒවා සාමාන්‍ය පාඨකයාගේන් දුරස් වූ නිර්මාණ බව සිතේ. පශ්චාත් යුද සමයේ ශ්‍රී ලාංකේය සමාජ, දේශපාලනික තතු හුවා දක්වන්නා වූ 'ඇමේසන් ගින්න' මෙන් ම දෙමළ සම්භවයක් ඇති මෙහෙකාර ස්ත්‍රියක විෂය

[47] එම, පි. 93

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

කරගත් 'යකඩ බාල්දිය' ද සුළු ජාතීන්ගේ ගැටලු දෙස මානව දයාවෙන් බැලීමට පාඨකයාට කරන ආමන්ත්‍රණ වශයෙන් සැලකීම වැරදි නොවේ. සිළිඳුගේ දියණිය ද මෙහි එන සාර්ථක කෙටිකතාවකි. භික්ෂු වාට්ටුව කෙටිකතාවෙන් සාකච්ඡා කෙරෙන්නේ පාස්කු ප්‍රහාර සිද්ධිය හා ඉනික්බිති ව හට ගත් මුස්ලිම් විරෝධය පිළිබඳවයි. එහි කේන්ද්‍රීය චරිතය වන භික්ෂුවගේ චරිතය කතාකරු ඉතා සියුම් ලෙස හසුරුවා ඇති බව පෙනේ. අභිනික්මන කෙටිකතාවෙන් සාකච්ඡා වන්නේ සමාජයේත් සමාජ රටාවේත් වෙනස් වීම පුද්ගල අධ්‍යාත්මයට දැනෙන ආකාරයයි. කතාකරුවාගේ ජීවිතානුභූතීන් සමග බද්ධ ව ඇති මීගමුව පසුබිම් කොට ගැනුණු එම කෙටිකතාව, භාව නිරූපණයෙහි ලා එරික් දක්වන කෞශල්‍යය විශේෂ වශයෙන් ප්‍රකට කරන්නකි.

"ඉස්සර මීගමුව ප්‍රමාද වී අඳුර ගලන දුම්කොළ ටවුමක්, බයිස්කෝප් ටවුමක්, කැවුම් ලෑතර ටවුමකි. එහි සිටි කිසිවකුට දුම්කොළ ගන්ධය මඟ හැර සිටින්නට නොහැකි විය. දුම්කොළ තෝරන පොල් අතු මන්දිර අතිවිශාල ඒවා වූ අතර කිසියම් නිහතමානිකමකින් යුතුව පාරට බෑවුම් වන ලොකු වහලින් යුතු විය. කැවුම් හා ලෑතර තිබුණේ එළවළු මාකැට්ටුවේ විවෘත දොරකඩය. චිත්ත ඇඳ ගත් ගැහැනු වට්ටි, හට්ටි හා බෝතලවල දමා ගෙන විකුණුහ.

හිටිහැටියේ සියල්ල වෙනස් විය. බීඩි බීම හා දුම්කොළ කෑම නතර විය. අංගුලිමාල පෙන්වා විවෘත කර තිබුණු රාජ් හෝල් ගිනි තබන ලද අතර රීගල්, නඩරාජා හා මීපුර තියටර් එකපස එක වැසී ගියේය. රුක්මනී හදිසි රිය අනතුරකින් මිය ගියාය. මඤ්ඤොක්කා හේනේ සිදු කරන ලද භූමදානය වෙනුවෙන් අතිවිශාල ජනකායක් එක් රොක් වුණු අතර මහනගර සභාවට පැමිණි මොහිදීන් බෙග් බුද්ධං සරණං ගීය ගායනා කරන්නා සේ හඬ නගා ඇඬුවේය. ඉන් පසු මීගමුව ටවුම වෙනුවෙන් අඬන්නට කඳුළු නැති විය."[48]

මෙහි ඇතුළත් අවාරිස්ගේ යතුරුපැදිය අපූර්ව චරිතයක් හා එම චරිතය හා බැඳුණු මනෝභාව සියුම් ලෙස විවරණය කරන්නකි. කතාව පාඨකයා තුළ ජීවමාන වන්නේ කෙටිකතාකරුවා එහි පසුබිම නිරූපණය කර ඇති විලාසය අනුව ය. කැස්බෑව-වාද්දුව මාර්ගයෙන් දොඩම්ගොඩට පැමිණ අධිවේගී මාර්ගය ඔස්සේ ගාලු කොටුවට යන මිතුරන් තිදෙනෙකුගේ අත්දැකීම් ඇසුරු කොටගත් 'මැටි කෝප්පය, ගල් ඔරලෝසුව හා කපුරු බෝල' අසාමාන්‍ය කතා තුනකි. ඒවායෙන් පාඨකයා රැගෙන යනුයේ කාල්පනික වූ අද්භූත ලොවක් වෙත ය. මහදහවලේ තම වයස්ගත අඹුව සමග රති සම්භෝගයේ යෙදෙන කට්ටඩියෙකු ද යාපනය කෝවිලක කුල ගර්වයෙන් ඉල්පී ගිය ජනයා අතරේ කටයුතු කරමින් දීර්ඝ කාලයක් ක්‍රියා විරහිතව තිබූ පැරණි ගල් ඔර්ලෝසුවක් සෑදීමට පැමිණි ස්විස් ජාතිකයෙකු ද එම අතුරු කතාවල දී පාඨකයාට හඳුනා ගන්නට ලැබේ. 'කමලනාත් නම් වහලා' ඉකුත් සියවස මධ්‍ය භාගයේ දී රා පෙරීම සඳහා ඉන්දියාවේ සිට පැමිණි තරුණයෙකු අලලා ලියැවුණු කෙටිකතාවකි. 'වහලා' යන සංකල්පය පිළිබඳ ගැඹුරු අර්ථ නිරූපණයක් එහි යටිපෙළින් ගම්‍යමාන වෙයි. කුණුකාරයෝ වැනි කතාවල එතරම් සාර්ථකත්වයක් නොපෙනෙතත් ඒවායෙහි දී සමාජයේ පහත් තත්ත්වයක් නියෝජනය කරන පීඩිත පාන්තිකයන්ගේ ජීවිත පාඨකයා වෙත සමීප කිරීමට දරා ඇති උත්සාහය අගය කළ හැකි ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES - 28

[48] 'විශ්‍රාමික පෙම්වතිය', පි. 50

අනුරසිරිගේ කෘතියෙහි මෙන් ම එරික්ගේ කෘතියෙහි ද විද්‍යමාන වන විශේෂත්වය නම් වචනයෙන් කියන කතාවට වඩා හැඟවෙන්නට සලස්වන කතාව වඩාත් ප්‍රබල වීමයි. විශ්‍රාමික පෙම්වතිය කෘතියට කෙටිකතා 15ක් තරම් විශාල සංඛ්‍යාවක් ඇතුළත් වන බැවින් ද ඒවායෙන් බහුතරයක් ම සාර්ථක වී ඇති බැවින් ද වසරේ සියලුම කෙටිකතා සංග්‍රහ අතුරින් එම කෘතිය විශිෂ්ටතම කෙටිකතා පොතක් වශයෙන් සම්මානෝත්සව කිහිපයක දී ම ඇගයුමට පාත්‍ර වී තිබීම අසාධාරණ යැ'යි නොකිව හැකි ය.[49]

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ඉලයප්පාරච්චි, එරික් (2019) 'විශ්‍රාමික පෙම්වතිය', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

කම්මැල්ලවීර, ජයතිලක (2009) 'අන්තිම කැමැත්ත', විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ.

කම්මැල්ලවීර, ජයතිලක (1985) 'කළු සපත්තු', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

කම්මැල්ලවීර, ජයතිලක (2019) 'කැඩපත් දහයක්', විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ.

කම්මැල්ලවීර, ජයතිලක (2011) 'මාංචු', විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ.

කම්මැල්ලවීර, ජයතිලක (2009) 'ලේ', විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ.

ගමගේ, කපිල එම්. (2019)'අපරාදෙ ඒ නොවැම්බර්', ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ.

මල්ලවආරච්චි, අමාලි අනුපමා (2019) 'දං පඳුරට ආ රැහැයියා', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

රත්නායක, මහින්ද (2019) 'සිහින කුමරා', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

වීරසිංහ, අමිත්ත (2019) 'කන්කොටාගේ ප්‍රේමය සහ තවත් කතා', Ni-Cey International (pvt) Ltd, රාජගිරිය.

සෙනෙවිරත්න, සුමුදු නිරාගී, (2017) 'ගිහින් එන්න කානිවල්', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ

සෙනෙවිරත්න, සුමුදු නිරාගී, (2019) 'සිතුවමෙන් නෙරපූ කිඳුරෙක්', විදර්ශන ප්‍රකාශකයෝ, දෙහිවල.

සෝමවීර, ඉසුරු චාමර (2019)'ගැහැනු පිරිමි මල් පලතුරු', Grantha (Pvt) Ltd" කොළඹ.

හෙට්ටිගේ, අනුරසිරි (2019) 'මැරීන් ඩ්‍රයිව්', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.
(2015) 'දිමියා', ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 2015

වික්‍රමාරච්චි, සමන්, (2018 සැප්තැම්බර් 01), 'සම්මානයකට නිර්දේශ වීමෙන් පොතකට පිළිගැනීමක් ලැබෙනවා', ('ස්වර්ණ පුස්තක අවසන් වටයට නිර්දේශ වූවෝ මෙසේ පවසති'), පුන්කලස අතිරේකය.

රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානය (2020), ග්‍රන්ථ සමීක්ෂණය - අවසන් වටය, සමීක්ෂණ පත්‍රිකාව


[49] මෙම ලිපිය ලියැවෙන අවස්ථාව වන විට රජත පුස්තක, විදෙලාදය, ගොඩගේ සම්මාන යන සාහිත්‍ය උත්සව පවත්වා අවසන් වුව ද රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවය පවත්වා නොමැති බව සැලකිය යුතු වේ. එම සම්මාන උත්සවවල දී රජත පුස්තක සම්මානය අනුරසිරි හෙට්ටිගේගේ 'මැරීන් ඩ්‍රයිව්' කෘතියට හිමි වූ අතර සෙසු සම්මාන එරික් ඉලයප්පාරච්චිගේ 'විශ්‍රාමික පෙම්වතිය' කෘතියට හිමි විය. (මෙම ලිපිය පළ වන අවස්ථාව වන විට රාජ්‍ය සාහිත්‍ය සම්මානය 'සිතුවමෙන් නෙරපූ කිඳුරෙක්' කෘතිය සඳහා පිරිනැමෙන බව නිවේදනය කර තිබිණ.)

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සව සමරු කලාපය (2014), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. (https://noolaham.net/project/816/81558/81558.pdf)

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

# Sri Lankan Commercial Artists of the Pre-Digital Era (1900-1990): A Case Study of the History of Graphic Design in Sri Lanka

*A. Amarakoon*

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28


## Abstract

Commercial art was introduced to the field of visual arts in Sri Lanka during the Colonial period, in parallel to European academic art. The artists and their work influenced by European art is well-documented and interpreted as a cohesive body of knowledge in their contribution towards the development of visual arts in Sri Lanka. Yet it is problematic that, many of the commercial artists and their work are neither systematically studied nor documented in a similar manner. Evidently, several well-known painters and sculptors have contributed to the commercial art industry, according to their biographies. However, commercial artists and their collective contribution to the development of commercial arts in Sri Lanka has not been studied as a part of the history of visual arts in Sri Lanka. Therefore, this study attempts to examine and identify the work of artists and designers of the 'pre-digital era' (era before the advent of digital methods) of commercial art in Sri Lanka.


***Keywords**:* Graphic Design, Commercial Artists, Sri Lanka, the Pre-digital era, Visual Arts,

## 1. Introduction

In the broader discipline of Fine Arts in Sri Lanka, western rooted disciplines identified by the terms 'Visual Arts' and 'Graphic Design' have only a short period of existence, appearing during the Colonial era. Both these disciplines were introduced to Sri Lanka during the Colonial era. Western rooted visual arts clearly stand out from the traditional Sri Lankan visual arts which has continued for hundreds of years and produced within a Buddhist religious context. Colonialism introduced new mediums and painting techniques such as oil painting on canvas and watercolor on paper as well as new subject matter and new dimensions for the creation of arts as well as for the purpose of creating art. During the period of British rule 'graphic design' forms such as print publications, logo design, typography, and poster design were developed and implemented in the Sri Lankan social context. ‘Graphic design' in the subsequent era were the products of a rigorous manual process where artists or designers used manual tools and techniques for creating commercial artwork since any digital method was not introduced in this era. As a matter of fact, the graphic design process had been based on manual methods all over the world, until from the 1980s to the early ’90s, advances in digital computer hardware and software radically altered graphic design process (Meggs, 2020). Hence the era before the 1990s can be identified as the 'pre-digital' era of graphic design.

The artists and their work during the Colonial era and the era following independence is well-documented and archived, studied and interpreted as a cohesive body of knowledge for their contribution to the field of Sri Lankan art, as well as in engaging with social and political contexts. Yet it is problematic that many of the activities subsumed under the term 'graphic design' in this pre-digital era are not properly documented, despite the fact that many well-known artists have worked as designers, to create logos, posters, book covers and advertisements. A number of well-known artists have not only worked as commercial artists, but they have also trained many others in this specific discipline. Even though the information about these well-known artists’ achievements as commercial artists can be found in their biographies, there is no descriptive record about their work or their design process. Therefore, it is apparent that the 'history of graphic design in Sri Lanka' is identifiable only as individual achievements of a few selected artists, rather than as a cohesive body of knowledge encompassing the complexity of its development.

Apparently, the problem of defining approaches to document the history of graphic design is evident in America and Europe as well. It is suggested by Triggs (2009, 2011) that graphic design history is less established as a discipline when compared to other design disciplines such as fashion & industrial design, although the history of graphic design as well as the theories,

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

